උපුල් ජෝෂප් ප්‍රනාන්දුගේ
**ගුරුද විග්‍රහය**

රු.100

2026.06.28 ඉරිදා | හත්වැනි කාණ්ඩය | 49 වැනි කලාපය


දැන් ඉරිදා

# මව්බිම



## හොරු සහ බොරු

P » 04







# අල්ලගෙන ආපු පාතාල ප්‍රබලයෝ

## ලැයිස්තුව මෙන්න

රතු වරෙන්තු නිකුත් කරයි

තවත් 95ක් එළියේ

P » 02



## සජිත් චරිත්ට පියවර ගත්තා

P » 02

## අනුර රංවලට කුමාරට ගත්තේ මොනවද?

## භාණ්ඩාගාරයේ ඩොලර් කොල්ලය

සූරියප්පෙරුමගෙන් එකයි

නන්දලාල්ගෙන් එකයි

වාර්තා දෙකයි ඇත්ත මොකක්ද?

P » 02

## එල්නිනෝ පටන්ගත්තා මෙන්න ලංකාවට වෙන්න යන දේ

අතිශය දරුණු කාලගුණික විපර්යාසයන් සිදුකළ හැකි එල්-නිනෝ තත්ත්වය මේ වනවිට ලංකාව ආශ්‍රිත කොට ගෙන...

P » 02

## ලංකාවේ තිකට් තහනම්?


ෂා අනුරට දුන්න ඇත්ත පණිවුඩය

P » 02





## පාතාලයෙන් කෝල් 92ක් ආපු දේශපාලන නායකයා කවුද?

P » 02





# සියලු කාන්තාවන්ට ලොකු පාඩමක් උගන්වපු ශ්‍යාමාගේ ඝාතනය

**මුන්ට අහුවෙන්න එපා**

**මුළු රටම කම්පනයට පත්කළ මේ සිදුවීම පිළිබඳ අදටත් බොහෝ දෙනාගේ සිත්තුළ එකම ප්‍රශ්නයක් ඉතිරිව තිබේ. ඇත්තටම ශ්‍යාමා දර්ශනීට සිදුවූයේ කුමක්ද? එය සියදිවි නසාගැනීමක් නොව ඝාතනයක් බවට මේ වනවිට තහවුරු වී ඇත. නමුත් මේ සියල්ලටම වඩා හදවත කම්පා කරන්නේ මියගිය තරුණියගේ ජීවිත කතාවයි.**

වැලිගම පදිංචිව සිටි ශ්‍යාමා දර්ශනී අධ්‍යාපනයේ ඉදිරියට ගොස් කොළඹ විශ්වවිද්‍යාලයෙන් භෞත චිකිත්සකවරියක ලෙස අධ්‍යාපනය හදාරා රෝගීන් වෙනුවෙන් කැපවුණු තරුණියක් වූවාය. තම වෘත්තියට ආදරය කළ ඇය රෝගීන් සුවපත් කිරීම වෙනුවෙන් උපරිම කැපවීමෙන් කටයුතු කළ බව ඇය සමග සේවය කළ අය පවා පවසනවා. පවුලේ සෙනෙහස මැද හැදී වැඩුණු ඇය තුළ විවාහය ගැන විශාල උනන්දුවක් නොවූ බව ඇගේ සහෝදරයා පවා පවසනවා. එහෙත් මාස කිහිපයකට පෙර ඇගේ ජීවිතයට පැමිණි පුද්ගලයකු කෙරෙහි ඇය සම්පූර්ණයෙන් විශ්වාසය තැබුවා. තමන් මෘදුකාංග ඉංජිනේරුවකු බවත්, උසස් පවුලකින් පැවත එන බවත්, විදේශගත වීමේ හැකියාව ඇති බවත් පවසා ඇය තුළ එම පුද්ගලයා ගොඩනැගූ ප්‍රතිරූපය හරහා ඔහු ඇගේ විශ්වාසය දිනාගෙන තිබුණා. විශ්වාසය යනු මනුෂ්‍යයකුට ඇති වටිනාම දායාදයයි. ඒ විශ්වාසය අවංක මිනිසකු අතට පත්වූ පසු ජීවිතය ලස්සන කරයි. නමුත් වංචාවකින් සැඟවුණු හදවතකට භාරවූ විට ඒ විශ්වාසය ජීවිතයම විනාශ කරයි. ඒ අනුව කැනඩාව බලා යෑමේ සිහිනය වෙනුවෙන් ඇය ලබාගත් ණය මුදල් නැවත ඉල්ලා සිටි පුද්ගලයන්ගේ පීඩනය සහ මානසික ආතතිය ඇයට දැඩි බලපෑමක් එල්ල කර තිබූ බව ඇගේ පවුලේ සාමාජිකයන් පවසනු ලබයි. ඒ අතරතුර ඇය හිටි හැටියේ අතුරුදන් වීමත්, ඇගේ මෘත ශරීරය මෝටර් රථයක් තුළ තිබී හමුවීමත් සමග රටම කම්පනයට පත්වුණේ, ඇයට සිදුවූ දේ පිළිබඳ ප්‍රශ්නාර්ථයක් ඉතිරිව තිබූ නිසායි.

මේ සිදුවීමෙන් තවත් බරපතළ ප්‍රශ්නයක් මතුකරයි. ඒ, කාන්තාවන් 30ක් පමණ රවටා, තවත් වංචනික ක්‍රියා රැසක් සම්බන්ධයෙන් උසාවි ගණනාවක නඩු විභාග වෙමින් තිබියදී මේ සැකකාර පුද්ගලයා කෙරෙහි මීට පෙර නිසි පරිදි ක්‍රියාමාර්ගයක් ගෙන තිබුණා නම් අද ශ්‍යාමා ජීවත්ව සිටින්නට තිබුණා නොවේද යන්නයි.

මේ සිදුවීම වාර්තා වුණේ පසුගිය 16 වැනිදායි. ඒ අනුව, තෙල්දෙණිය පොලිසියට දුරකතන ඇමතුමක් ලැබෙන්නේ තෙල්දෙණිය රෝහලේ රථගාලේ නවතා ඇති වාහනයක් තුළ කාන්තා මළ සිරුරක් ඇති බවටයි. එම ඇමතුමට අනුව ක්‍රියාත්මක වූ තෙල්දෙණිය පොලිසිය අදාළ රථය පරීක්ෂා කර කාන්තා මළ සිරුර රථයෙන් එළියට ගැනීමට කටයුතු කළා. එලෙස මියගොස් තිබුණේ වැලිගම පදිංචිව සිටි අම්පාර රෝහලේ සේවය කළ භෞත චිකිත්සකවරියක් වූ 34 හැවිරිදි ශ්‍යාමා දර්ශනී නැමති තරුණිය බව හෙළිකර ගැනීමට පොලිසිය සමත් වුණා.

තමන් මෘදුකාංග ඉංජිනේරුවරයෙක්, තමාට ලොකු පිළිගැනීමක් තියෙනවා, තමා යටතේ විශාල පිරිසක වැඩකරනවා යැයි පවසා ඇගේ පෙම්වතා ඇය රවටා තිබුණා. ඔහු තරුණියගේ ගමට ඩ්‍රෝන කැමරාවක් ගෙනැවිත් විවිධ ක්‍රියාකාරකම් ද සිදුකර තිබුණු නිසා ඔහුට එම ගමේ ළමයින් 'ඩ්‍රෝන මාමා' යන නමින් අමතා ඇති බවද සඳහන්ය.

ඒ විදියට ඔහු, තමන්ට නැති ප්‍රතිරූපයක් නිර්මාණ කර හැමෝගෙම හිත් දිනාගන්නවා. ඊට පස්සේ තමයි කැනඩාවට යන රඟපෑම පටන්ගන්නේ. සැකකරුගේ රැවටිලි බස්වලට හසුවී මේ තරුණිය බැංකුවලින් සහ විවිධ පුද්ගලයන්ගෙන් ණයට මුදල් ලබාගෙන ඇත. එලෙස ලබාගත් ණය මුදල්වල වටිනාකම රුපියල් කෝටි එකහමාරක් පමණ වන බවයි ඇගේ සහෝදරයා පොලිසියට හමුවේ පවසා තිබුණේ. එලෙස ණයට මුදල් ලබාදුන් මිනිස්සු පුද්ගලයන් නැවත එම මුදල් ඉල්ලා සිටීම හමුවේ ඇය දැඩි මානසික පීඩනයකට ලක්වන්නට ඇති. ඒ පීඩාව දරාගැනීමට නොහැකි නිසාම ඇය නුවරඑළියේ හෝටලයක ගිහින් නවතින්නට ඇති. ඇය එලෙස යන බව නිවැසියන්ටද පවසා තිබුණා. පසුව දින ගනනාවක් තිස්සේ අතුරුදන්ව සිටි ඇයගේ මෘත ශරීරය මෝටර් රථයක් තුළ තිබී හමුවෙනවා.

මරණ පරීක්ෂණ වාර්තාවට අනුව ඇගේ බෙල්ලේ තුවාල කිහිපයක් සහ පොරබැදූ සලකුණුත් නිරීක්ෂණය වී තිබුණා. ශරීරයේ කැනියුලාවක් වැනි යමක් තිබූ බවද නිරීක්ෂණය වී ඇත.

මේ තරුණිය 2023 වර්ෂයේ සිට අම්පාර රෝහලේ සේවය කර තිබුණා. විදෙස් ගතවන බව පවසා 2025 වර්ෂයේ සේවයෙන් ඉල්ලා අස්වී ඇත. ඇය මෙම පුද්ගලයා සමග සම්බන්ධය ගොඩනගාගෙන තිබුණේ මීට මාස 08කට පමණ පෙරය. ඇය ඔහු හඳුනාගෙන ඇත්තේ දිනෙත් යන නමින්. නමුත් ඔහුගේ සැබෑ නම දිනෙත් නොවන බවයි විමර්ශනවලදී හෙළිව ඇත්තේ. තම නැගණිය මහල් නිවසක නවාතැන් ගෙන සිටින බවත්, ඇය දින ගණනක් ආහාර ගෙන නොමැති බවත්, ඇය රැඳී සිටි ස්ථානය පරීක්ෂා කිරීමට සහාය අවශ්‍ය බවත් ඝාතනයට ලක්වූ තරුණියගේ සහෝදරයා පසුගිය 17 වැනිදා උදෑසන නුවරඑළිය පොලිසියෙන් ඉල්ලීමක් කරමින් සඳහන් කර තිබුණා. ඒ අනුව නුවරඑළිය පොලිසියේ නිලධාරීන් කණ්ඩායමක් එම ස්ථානයට ගොස් අනාවරණ කරගෙන තිබුණේ එය මහල් නිවසක් නොව හෝටලයක් බවටයි. ඒ ස්ථානයේ අදාළ තරුණිය නොමැති බවත් ඔවුන් අනාවරණ කරනු ලැබුවා. හෝටල් සේවකයන් පවසා තිබුණේ අදාළ තරුණිය පසුගිය දෙවැනිදා හෝටලයට පැමිණ නැවත 10 වැනිදා ඉන් පිටව ගොස් ඇති බවයි. කෙසේ වෙතත් පසුගිය 16 වැනිදා මේ කාන්තාව හෝටලයට තනිව පැමිණ තිබුණා. එහි ආරක්ෂිත කැමරා පරීක්ෂා කිරීමේදී පොලිසියට දැකගන්නට ලැබුණේ 16 වැනිදා රාත්‍රී 9.50ට පමණ තරුණියගේ පෙම්වතා හෝටලයට පැමිණෙන අයුරුයි. මිනිත්තු 40ක් පමණ ඒ හෝටලයේ කාමරයේ රැඳී සිටි එම පුද්ගලයා රාත්‍රී 10.30ට පමණ සිහිසුන් වී සිටි තරුණිය රැගෙන පිටතට පැමිණෙන ආකාරය ආරක්ෂිත කැමරාවල සටහන් වී තිබුණා.

හෝටලයේ ආරක්ෂක නිලධාරීන් පොලිසියේ ප්‍රශ්න කිරීම් හමුවේ පවසා තිබුණේ මේ පුද්ගලයා තම බිරිඳ රෝගාතුරව ඇති බැවින් රෝහලට රැගෙන යන බවය. එදින රාත්‍රියේ මළ සිරුර මෝටර් රථයේ ඉදිරි අසුනේ තබාගෙන ආරක්ෂිත පටිද ඇයට පලඳවාගෙන තෙල්දෙණිය ප්‍රදේශයට රැගෙන ආ බව පසුව හෙළිවුණා. එම මෝටර් රථය පිටුපසින් ඔහුගේ අනියම් බිරිඳ දරුවන් තිදෙනකුද සමග වෑන් රථයකින් පැමිණ තිබූ බව ආරක්ෂිත කැමරාවල සටහන්ව තිබුණා.

මේ අතර, තෙල්දෙණිය පොලිසියේ ස්ථානාධිපතිවරයාට දුරකතන ඇමතුමක් ලැබී තිබුණේ තෙල්දෙණිය රෝහලේ රථගාලේ වාහනයක් තුළ කාන්තා මළ සිරුරක් ඇති බවටයි. පසුව කළ පරීක්ෂා කිරීම්වලදී අනාවරණ වී තිබුණේ නුවරඑළියෙන් අතුරුදන් වූ කාන්තාවගේ සිරුර එහි ඇති බවටයි.

සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමට සොයන සැකකරු කටුගස්තොට ප්‍රදේශයේ රෙදි සාප්පුවක්ද පවත්වාගෙන ගොස් තිබුණා. ඔහු එම රෙදි සාප්පුවේ සේවකයන් දෙදෙනාටද පවසා ඇත්තේ රෙදි සාප්පුව වසාදමන ලෙසයි. මෙම පුද්ගලයාගේ මව, පියා සහ වැඩිමහල් සහෝදරයන් සිටින නාරම්මල ප්‍රදේශයේ නිවසට ගොස් පොලිසිය ප්‍රශ්න කර තිබුණා. පුතා තමාට වරින් වර රුපියල් ලක්ෂයක් හෝ දෙකක් එවන බවත් අවුරුදු 8කින් පමණ පුතාව දැක නොමැති බවත් මව එහිදී පොලිසියට පවසා තිබුණා. සැකකරුගේ සහෝදරයා පවසා ඇත්තේ තම බාල සහෝදරයා විවිධ පුද්ගලයන්ගෙන් මුදල් ලබාගෙන යළි ඒවා නොදී මගහැර සිටින නිසා ඔහු නිවසට ආ පසු එළවා දැමූ බවයි.

සැකකරු නීත්‍යානුකූලව විවාහ වූ අයකු වන අතර, ඔහුට එක් දරුවකුද සිටින බව හෙළිව තිබේ. ඔහු තරුණියන් 30ක් පමණ රවටා ඇති බවත්, ඔහුට විරුද්ධව නඩු විශාල ප්‍රමාණයක් අලුත්කඩේ, ගම්පහ සහ තිස්සමහරාම යන අධිකරණවල විභාග වන බවත් පසුව සිදුකළ විමර්ශනවලදී හෙළිව ඇත.

මේ අතර, පෙම්වතා යැයි සැලකෙන පුද්ගලයා සම්බන්ධයෙන් තවත් කරුණු රැසක් අනාවරණ කර ගැනීමට පොලිසියට හැකිව තිබුණා. ඔහු පරිගණක මෘදුකාංග ඉංජිනේරුවරයෙක් ලෙස ව්‍යාජ ලෙස පෙනී සිට ඇති අතර, ඔහුගේ සැබෑ පදිංචිය කුරුණෑගල නාරම්මල බවද අනාවරණ වී ඇත. මොහු ඉංජිනේරුවරයෙකු යැයි පවසමින් මහනුවර සහ මාතලේ ඇතුළු විවිධ ප්‍රදේශවල කාන්තාවන් රවටමින්, උසස් රැකියාවන් කරන සහ ධනවත් ව්‍යාපාරික තරුණියන් සමග සම්බන්ධකම් පවත්වාගෙන ගොස් ඇති බවද අනාවරණ වී තිබුණා. බොරු කොණ්ඩයකින් සිය තට්ට හිස වසාගෙන පෙනුම වෙනස් කරගෙන සිටි ඔහුගේ කඩවසම් බවට සහ කතාබහට එම තරුණියන් රැවටී ඇති බවයි හෙළිව ඇත්තේ.

ඝාතනයට ලක්වූ ශ්‍යාමා දර්ශනීගේ සහෝදරයා හදවතේ කැකෑරෙන වේදනාව පිටකළේ මෙලෙසයි.

'මගේ චූටි නංගි මට වැඩිය අවුරුදු 16ක් බාලයි. අපේ පවුලේ හුරතලේට හැදුණේ. චූටි නංගි මම තාත්තාට වඩා වඩාගෙන ඉඳලා ඇති. ඇය ඉගෙන ගන්න හුඟාක් දක්ෂයි. අපිට යන්න බැරිවුණු තැනට චූටි නංගිව අරගෙන යන්න ඕනේ කියලා අපි ඇය වෙනුවෙන් ගොඩාක් කැපවීම් කළා. ඇය වැලිගම සුමංගල බාලිකාවට ගියේ. කොළඹ විශ්වවිද්‍යාලය තමයි භෞත චිකිත්සක උපාධිය හදාරන්න ඇය තෝරගත්තේ. භෞත චිකිත්සකවරියක් ලෙස අම්පාර රජයේ රෝහලට තමයි ඇයට පළමු පත්වීම ලැබෙන්නේ. ඇය මානසික චිකිත්සක පාඨමාලාවක් හදාරලා ඒකෙත් උපාධිය ගත්තා. රෝගියෙක් බේරගන්න වුණොත් ඒ වෙනුවෙන් එයා උපරිම මහන්සි වෙලා කටයුතු කරනවා. ඇයට වයස 33 වෙනකොට අපි හැමෝම ඇයට විවාහයක් කරලා දෙන්න උත්සාහ කළා. මංගල යෝජනාවලට දැම්මා. අවසානයේ ඇය කිව්වේ 'අයියේ මට කරදර කරන්න එපා. මම කසාද බඳින්නේ නැහැ' කියලා. අපි හිතුවේ එයා අධ්‍යාත්මික පැත්තට යොමුවෙයි කියලා. ගිය අවුරුද්දේ දවසක මට කෝල් එකක් එනවා නංගිගෙන්. මට හරියටම දිනේ මතක නැහැ. 'අයියේ මම බඳින කෙනා හොයාගත්තා' කියලා කිව්වා. මම කිව්වා අපිට විස්තර ඕනේ කියලා. එතකොට මට එයා ෆොටෝ එකක් එව්වා. එයා විස්තර වගයක් කිව්වා. 'එයා සොෆ්ට්වෙයාර් ඉන්ජිනියර් කෙනෙක්, අපිට වඩා උසස් පෙළපතක් තියෙන කෙනෙක්, අපිට ගැළපෙන්නේ නැහැ, නමුත් එයා කැමැතියි ඒ පවුලෙන් වෙන්වෙලා මාව කසාද බඳින්න' කියලත් මට කිව්වා. 'එයා දළදා මාලිගාවේ දිසානායක මුදලිතුමාගේ පුතා, ඇතෙක් පවා ඉන්නවා, එයාලගේ ගෙදර තියෙන්නේ ගන්නෝරුවේ යුද හමුදා කඳවුරට උඩ පාරේ' කියලත් කිව්වා. මම ඇහුවා කොහොමද ඔයාට නුවර කෙනෙක් හම්බවුණේ කියලා. ඇහුවාම කිව්වේ තිළිණි කියලා කෙනෙක් අම්පාර කච්චේරියේ වැඩකරනවා. ඒ ගෑනු කෙනා පිසියෝ තෙරපිවලට ඇවිත් මෙයාත් ඇවිත් තිබුණා. මේ තුන්දෙනා අතර යාළුකමක් ඇතිවෙලා තිබුණා. නිතරම මේ පිරිමි කෙනා කියලා තිබුණේ මේ ආව ගෑනු කෙනා තමයි බඳින්න හිටියේ නමුත් මට ගැළපෙන්නේ නැහැ එයාගේ හැසිරීම මට අල්ලන්නේ නැහැ. මම ඔයාව බඳින්න කැමැතියි කියලා. කාලයක් යනකොට අම්පාර කච්චේරියේ ගෑනු කෙනා මේ තුන්දෙනා අතරින් අයින් වෙනවා. නංගි ගෙදර එන දවසට මේ තරුණයා නංගිව දාලා යනවා. ඉන්නේ නැහැ. ආයෙ යන දවසට එක්කන් එන්න එනවා. නංගි මගෙනුත් ලක්ෂ තුනක ණය මුදලක් අරගෙන ඒකත් ඒ දවසටම බේරුවා. මගේ යාළුවෙක් නුවර ඉන්නවා. එයාගෙන් විස්තර ඇහුවාම මට කිව්වා දිසානායක මුදලිතුමා කියලා කෙනෙක් ඉන්නවා එයාගේ පුතා කටුනායක එයාර්පෝර්ට් එකේ සොෆ්ට්වෙයාර් ඉංජිනියර් කෙනෙක් කියලා. හැබැයි ඒ ගෙදර දොර නම් වහලා තියෙන්නේ කියලා. මට නංගි කිව්වා අයියා විස්තර හොයන්න යන්න ඕනේ නැහැ, ඒ සියලු විස්තර හරි කියලා. එයා අපේ ගෙදර එනකොට ඩ්‍රෝන කැමරාවක් ගෙනාවා. එයා කියන්නේ ඒක වාහනේ තියෙනවා කියලා. අපිව දවසක් කතරගම ගිහිල්ලා වී.අයි.පී. ගේට්ටුවෙන් ඇතුළටත් ගත්තා. ඒ යන්න ඉස්සෙල්ලා කිව්වේ මම මාස්ක් එකක් දාගන්නම් එතැන අය අඳුරගත්තොත් ලොකු ප්‍රශ්නයක් වෙනවා කියලා. නංගි අසනීප වෙලා ඉන්නකොට මම ඇහුවා ඇයි කියලා. එතකොට කිව්වා අයියේ මම කැනඩා යන්න ලක්ෂ 50ක් විතර ණයට ගත්තා කියලා. පස්සේ කිව්වා ලක්ෂ 150ක් විතර කියලා. දිනෙත්ගේ ඉඩමක් තියෙනවා ඒ ඉඩම විකුණලා සල්ලි දෙනවා කිව්වා.

මම නංගිගේ අපාර්ට්මන්ට් එකට යන අතරතුර මම කෝල් 100කට වැඩිය ගත්තා. නංගි ආන්සර් කළේ නැහැ. මම කෝකටත් පොලිසියට ගිහින් පොලිස් නිලධාරියෙක් සමග ගියා. ගිහින් ආරක්ෂක නිලධාරියාගෙන් සහ මැනේජර්ගෙන් ඇහුවාම මේ පුද්ගලයාට දුරකතන ඇමතුමක් ලබාගත් විට ඔහු පැවසුවේ අපි මේ ඇතුළේ ඉන්නවා, අක්කට ටිකක් සනීප නැති නිසා කාමරේ ඉන්නවා කියලා. කාමරේ ඉන්නවා කිව්වත් ඔවුන් කාමරේ ළඟට ගොස් තට්ටු කළද කවුරුන් හෝ දොර ඇරියේ නැහැ. නැවතත් මේ පුද්ගලයාට දුරකතන ඇමතුමක් ගෙන ආරක්ෂක නිලධාරියා ඔහුට පැවසුවේ පොලිසියෙන් ඇවිත් ඔයාව හම්බවෙන්න කියලා. එවිට ඒ පුද්ගලයා දුරකතන ඇමතුම කට් කළා. කාමරේ දොර අරින්න යතුරක් නැති නිසා ආරක්ෂක නිලධාරියා සහ පොලිස් නිලධාරියා ජනේලයක් විවෘත කර කාමරය පරීක්ෂා කළත් ඇතුළේ දත්බුරුසුවක් පමණයි තිබුණේ. පස්සේ සී.සී.ටී.වී. පරීක්ෂා කළා. එතකොට තමයි දැකගැනීමට හැකිවුණේ රෑ 9.50ට විතර දිනෙත් දිසානායක කියන මනුස්සයා ඇවිත් වාහනය පාක් කරලා නංගිගේ බෑග් ටික දාලා නැවත උඩුමහලට ඇවිත් නැවත 10.28ට විතර මගේ නංගිව උස්සගෙන යනවා.

අපේ ලොකු නංගිට දිනෙත් කතා කරලා කියනවා චූටි නංගි ඉන්නවා, තව පැය එකහමාරකින් අපි කැනඩා යනවා, අපි දැන් එයාර්පෝට් එකේ ඉන්නේ, නංගි ගියා ඩොකියුමන්ට සබ්මිට් කරගන්න කියලා. එතකොට ලොකු නංගි කියලා තියෙනවා ඔයාලා රට ගියාට කමක් නැහැ චූටි නංගිට කතාකරන්න කියලා. ඔය තොරතුර මම නැවත පොලිසියට දැනුම් දෙනවා. ඉන් පස්සේ මුළු ලංකාවටම පොලිස් මැසේජ් එකක් යවනවා පින්තූර දාලා. ඒ වගේම එයාර්පෝට් එකටත් දැනුම් දෙනවා ගුවන් ගමන් නවත්තන්න කියලා. හවස 3ට විතර තෙල්දෙණිය පොලිස් ස්ථානාධිපතිතුමාට දුරකතන ඇමතුමක් එනවා තෙල්දෙණිය රෝහල අසල රථගාලේ වැගන් ආර් වාහනයක් තුළ කාන්තා මළ සිරුරක් ඇති බවට. මගේ හදවතට මාර දුකක් දැනෙනවා. මට තියෙනවා සැකයක් චූටි නංගි උස්සගෙන ගියේ ඇයි, චූටි නංගි මැරුවාද, මගේ හිතේම තියෙන්නේ චූටි නංගිව ඌ මැරුවා කියලයි...'

මියගිය තරුණියගේ සිරුර වැලිගම පවුලේ සුසාන භූමියේදී පසුගිය 19 වැනිදා මිහිදන් කෙරුණා.

සැකකරුගේ ඡායාරූප සහ දුරකතන අංකය සහිතව මාධ්‍ය මගින් දැන්වීම් පළකර, දුටු කෙනෙක් අමතන්න යනුවෙන් සඳහන් කර තිබුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය 24 වැනිදා උදෑසන සැකකරු යාපනය ප්‍රදේශයේදී අත්අඩංගුවට පත්වුණා. ඒ නියෝජ්‍ය පොලිස්පති රොහාන් ඕලුගල මහතාගේ මෙහෙයවීම යටතේයි. සැකකරු වැල්ලවත්තේ සිට යාපනය දක්වා බස් රථයකින් ගමන් කර තිබුණු බවයි එහිදී අනාවරණ වී තිබුණේ. සැකකරු සැලසුම් කර තිබුණේ යාපනයට ගොස් ඉන්දියාව බලා යාමටයි. ඒ වගේම මේ සැකකරුට සහාය ලබාදීමේ චෝදනාව මත මේ වෙද්දී ඉහළ පොලිස් නිලධාරියෙකුත් අත්අඩංගුවට පත්වෙලා.

අද බොහෝ තරුණියන් බාහිර පෙනුම, මුදල්, වාහන, උසස් රැකියා සහ විදේශ සිහින මත විශ්වාසයෙන් අනාගතය ගොඩනගයි. නමුත් සැබෑ වටිනාකම් තියෙන්නේ මනුෂ්‍යයකුගේ ගතිගුණ තුළයි. බොරුවෙන් ගොඩනැගුණු මාලිගා කාලයත් සමග කඩාවැටෙයි. නමුත් අවංකකම මත ගොඩනැගුණු සම්බන්ධතා පමණක් කාලය පරදා ජීවත් කරවයි.

අද ශ්‍යාමා නැත. ඇගේ මවුපියන්ගේ බලාපොරොත්තු නැත. සහෝදරයන්ගේ හුරතලේ සිටි චූටි නංගි නැත. රෝගීන් වෙනුවෙන් කැපවුණු භෞත චිකිත්සකවරිය නැත. ඉතිරිව ඇත්තේ වියළී නොගිය කඳුළු සහ සමාජයට ලැබුණු දැඩි අනතුරු ඇඟවීමක් පමණයි. විශ්වාස කිරීමට පෙර මනුෂ්‍යයා හඳුනාගන්න. සිහිනවලට වඩා සත්‍ය වටිනා බව මේ ඛේදවාචකය මුළු සමාජයටම නැවතත් සිහිපත් කර ඇත.



නිලන්ති රේණුකා

PAGE - 01

## අල්ලගෙන ආපු පාතාල...

ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා බලයට පත්වීමෙන් අනතුරුව මේ දක්වා විදෙස්ගතව සැඟව සිටි පාතාල නායකයන් ඇතුළු අපරාධකරුවන් 58 දෙනකු දිවයිනට රැගෙන ඒමට කටයුතු කොට ඇත.

මෙහිදී ජාත්‍යන්තර රතු නිවේදනවලට අනුව පිටරටින් අල්ලාගෙන ආ අපරාධකරුවන් සංඛ්‍යාව 23ක් වේ. රතු නිවේදන නොමැතිව පිටරට සැඟව සිටි අපරාධකරුවන් 14 දෙනකු ලංකාවට රැගෙන ඒමට පොලිසිය මේ දක්වා කටයුතු කොට තිබේ.

එමෙන්ම තවත් පාතාල අපරාධකරුවන් 95 දෙනකුට ජාත්‍යන්තර පොලිසිය මගින් රතු නිවේදන නිකුත් කිරීමටද වත්මන් ආණ්ඩුව යටතේ කටයුතු කොට ඇත. ඔවුන්ගෙන් කිහිප දෙනකු මේ වනවිට ඩුබායි, රුසියාව සහ ඉන්දියාව යන රටවල අත්අඩංගුවේ පසුවෙමින් සිටින බව දැනගන්නට ඇත.

වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ජනාධිපතිවරණ වේදිකාවේදී ලබාදුන් ප්‍රධාන ප්‍රතිඥාවක් වූයේ රටට මහා පිළිලයක්ව පවතින පාතාලය සහ මත්ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම අතුගා දැමීමට කටයුතු කරන බවකි.

මීට පෙර බලයට පත්වූ ජනාධිපතිවරුන් කිහිප දෙනකුම මෙම ප්‍රතිඥාව රටට ලබාදුන්නද එය සාර්ථක අවසානයක් කරා ගෙන යෑමට ඔවුන්ට හැකියාව ලැබී තිබුණේ නැත.

ඒ අනුව, 2015 බලයට පත්වූ මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පාලන කාලය යටතේ රටින් පලාගොස් සිටි ප්‍රබල පාතාල නායකයන් 8 දෙනකු අත්අඩංගුවට ගෙන යළි මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කොට තිබිණි.

ඉන් අනතුරුව බලයට පැමිණි ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පාලන සමයේදී කිසිදු පාතාල නායකයකු මෙරටට ගෙන්වා ගැනීමට හැකියාව ලැබී තිබුණේ නැත.

රනිල් වික්‍රමසිංහ මහතාගේ පාලන සමයේදී විදෙස් රටවලදී අත්අඩංගුවට ගෙන සිටි පාතාල නායකයන් 11 දෙනකු මෙරටට ගෙන්වා ගැනීමට හැකියාව ලැබී තිබිණි.

මේ සම්බන්ධයෙන් විශේෂ තොරතුරු රැසක් රැගත් ලිපියක් 5 වැනි පිටුවේ පළවේ.

## චරිත්ට පියවර...

අල්ලස් ගැනීමේ චෝදනාව මත චරිත් අබේසිංහ මහතා සම්බන්ධයෙන් සමගි ජන බලවේගය පැය 24ක් යෑමට මත්තෙන් ක්‍රියාත්මක වුවද, මාලිමාවේ බරපතළ චෝදනා එල්ල වී ඇති මැති ඇමැතිවරුන් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා ගත් ක්‍රියාමාර්ග මොනවාද යන්න වහාම රටට පැහැදිලි කරන ලෙස සජබ පාර්ලිමේන්තු මන්ත්‍රීනි චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය ආණ්ඩුවට අභියෝග කොට ඇත.

කිරිඇල්ල මහත්මිය එහිදී පෙන්වා දෙන්නේ චරිත් අබේසිංහ මහතාට චෝදනා එල්ල වී පැය 24ක් ඇතුළත වහාම ඒ මහතාගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි කිරීමටත්, ඒ මහතා දරන සියලු තනතුරුවලින් ඉවත් කිරීමටත් සමගි ජන බලවේගය කටයුතු කළ බවකි.

නමුත් ව්‍යාජ සහතික ඉදිරිපත් කොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත්වී කතානායකවරයා වශයෙන් කටයුතු කළ අශෝක රංවල මහතා සම්බන්ධයෙන් හෝ බාල ගල්අඟුරු ගෙන්වීමේ චෝදනාව මුල්කරගෙන ඇමැති තනතුරෙන් ඉවත් වූ සහ පොහොර ගෙන්වීම හරහා ආණ්ඩුවට පාඩුවක් සිදුකිරීමේ චෝදනාව මත මහාධිකරණය හමුවේ නඩු පවරා ඇති කුමාර ජයකොඩි මහතා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා ගත් ක්‍රියාමාර්ග රටට හෙළිකරන ලෙසද කිරිඇල්ල මහත්මිය අවධාරණය කොට ඇත.

## ලංකාවේ ක්‍රිකට්...

ලබන ජූලි මස 31 වැනි දිනට ප්‍රථම ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණය පැවැත්විය යුතු බවට ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සභාපති ජේ ෂා මහතා විසින් ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා වෙත දැනුම්දීමක් කර ඇති බව වාර්තා වේ.

පසුගියදා ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සභාපති ජේ ෂා මහතා ශ්‍රී ලංකාවට පැමිණ ජනාධිපතිවරයා සමග පැවැත්වූ සාකච්ඡාවේදී මෙම දැනුම්දීම කොට ඇති බව දැනගන්නට තිබේ.

යම් හෙයකින් ක්‍රිකට් ආයතනයේ නිලවරණය නොපවත්වා තවදුරටත් අතුරු පාලන කමිටුවේ කටයුතු පවත්වාගෙන යෑමට ක්‍රියා කරන්නේ නම් පවතින ජාත්‍යන්තර නීතිරීතිවලට අනුව කටයුතු කිරීමට සිදුවනු ඇති බවද මෙහිදී ජේ ෂා මහතා ජනාධිපතිවරයාට දැනුම් දී ඇති බව පැවසේ.

එහිදී ක්‍රිකට් අතුරු පාලක කමිටුවක් පත්කළ බංග්ලාදේශය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය අනුගමනය කළ ක්‍රියාමාර්ගයන් පිළිබඳවද මෙහිදී ජේ ෂා මහතා ජනාධිපතිවරයා දැනුවත් කර ඇති බව දැනගන්නට ඇත.

## ඩොලර් කොල්ලය...

රාජ්‍ය ණය ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය සතුව තිබූ ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් අතුරුදන් වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා විසින් රජයේ මුදල් පිළිබඳ කාරකසභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කර තිබේ.

මෙම කාරකසභාව ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් පසුගිය 23 වැනි දින පාර්ලිමේන්තුවේදී රැස්වූ අතර, එහිදී මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුව විසින් ලබාදුන් වාර්තා සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට තිබිණි.

අස්ථානගත වූ මුදල් සම්බන්ධයෙන් මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මීට පෙර වාර්තාවක් ඉදිරිපත් කර තිබූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් විසින් එය පරීක්ෂා කිරීමෙන් අනතුරුව තම මතය සහිත වාර්තාව මෙම රැස්වීමේදී කාරක සභාවට ඉදිරිපත් කොට තිබිණි.

අමාත්‍යාංශය සහ මහ බැංකුව විසින් ඉදිරිපත් කළ වාර්තා දෙකම සලකා බලා, ඒ පිළිබඳ අවසන් වාර්තාවක් සකස් කර ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සැලසුම් කර ඇති බව දැනගන්නට ඇත.

## එල්නිනෝ පටන්ගත්තා...

ආරම්භ වී ඇති බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පවසයි.

එහි අධ්‍යක්ෂ අජිත් විජේමාන්න මහතා පවසා සිටියේ මේ වනවිට එහි බලපෑම තවමත් විශාල වශයෙන් ලංකාවට දැනෙන්නට පටන්ගෙන නොමැති බවකි.

කෙසේ වෙතත් එල්-නිනෝ තත්ත්වය හේතු කොටගෙන ඉදිරියේදී වර්ෂාව විශාල වශයෙන් පහත වැටිය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා පෙන්වා දෙයි.

විශේෂයෙන්ම මෙම තත්ත්වය හේතුකොට ගෙන ජූලි-අගෝස්තු මාසවලදී නිරිතදිග මෝසම් තත්ත්වය අඩාළ වීමේ හැකියාවක් ඇති බවද ඒ මහතා අවධාරණය කරයි.

මේ අතර විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පාර්ලිමේන්තුවේදී අවධාරණය කර සිටියේ එල්-නිනෝ තත්ත්වයට මුහුණ දීම සඳහා ආණ්ඩුව ගෙන ඇති ක්‍රියාමාර්ග ඉතාම ප්‍රාථමික මට්ටමේ පවතින බවත්, වහාම ජනාධිපති කාර්යසාධක බළකායක් පිහිටුවා මෙම තත්ත්වයට මුහුණ දීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගත යුතු බවත්ය.

## පාතාලයෙන් කෝල්...

දැනට අත්අඩංගුවේ පසුවන කුඩු ව්‍යාපාරිකයන් සමග දේශපාලන නායකයකු 92 වතාවක් දුරකතන ඔස්සේ සාකච්ඡා කර ඇති බවට අනාවරණ වී ඇතැයි ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා පැවැසීය.

පසුගිය බ්‍රහස්පතින්දා (25) දිනයේදී පාර්ලිමේන්තුවේදී සිය කතාව සිදුකරමින් ජනාධිපතිවරයා පවසා සිටියේ මින් 54 වතාවක් මෙම දේශපාලන නායකයා විසින් සිරගතව සිටින කුඩු ව්‍යාපාරිකයන්ට ඇමතුම් ලබාදී ඇති බවකි. ඉතිරි 38 වතාවේදී සිරගතව සිටින කුඩු ව්‍යාපාරිකයන් මෙම දේශපාලන නායකයාට දුරකතන ඇමතුම් ලබාදී ඇති බවද ජනාධිපතිවරයා එහිදී කියා සිටියේය.

අවම වශයෙන් මෙම දේශපාලන නායකයා පිළිබඳ අදාළ පක්ෂය විසින් විනය පරීක්ෂණයක් හෝ ආරම්භ කළාද යන්න පිළිබඳ තමන් නොදන්නා බවද ජනාධිපතිවරයා එහිදී සඳහන් කළේය.



# විභාගෙ නෙමේ භාගෙ

**පුංචි පැටියෙක් පාසලට යන්නේ බලාපොරොත්තු දහස් ගණනක් පොදි බැඳගෙන. ඒ පුංචි පැටියගෙ දෑතින් අල්ලගෙන අම්මයි තාත්තයි දරු සිඟිත්තව පාසලට එක්කගෙන යනවා. තමන්ගෙ තුරුල්ලෙ තියාගෙන හදපු, ඇස් මානෙන් එපිටට නොයවපු පුංචි පැටියා පාසලට භාර දෙන්නේ දහසකුත් එකක් බලාපොරොත්තු එක්ක.**

පාසල් අධ්‍යාපනය කියලා කියන්නේ අතිශය විධිමත් එකක්. පෙර පාසලෙන් පස්සෙ එක ශ්‍රේණියෙ සිට දහතුන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය සඳහා ලංකාවෙ විශාල ආයතන ප්‍රමාණයක් නිර්මාණය වෙලා තියෙනවා. ජාතික අධ්‍යාපන ආයතනය ලොකු පරිශ්‍රමයක් දරලා, ලොකු මුදලක් වියදම් කරලා, ලොකු ශ්‍රමයක් කැප කරලා සෑම පන්තියකටම, සෑම ශ්‍රේණියකටම, සෑම විෂයකටම විෂය නිර්දේශ සකස් කරලා තියෙනවා. එකේ පන්තියට, දෙකේ පන්තියට, තුනේ පන්තියට මේ හැම පන්තියකටම මේ වැඩේ වෙනවා. ඒ වගේම ගුරුවරයෙක්ට තමන් කරන්න ඕනෙ වැඩේ මොකක්ද, තමන් නොකරන්න ඕනෙ දේවල් මොනවද කියලා දැනගන්න නිරන්තර වශයෙන්ම ගුරු පුහුණු තියෙනවා. මේ ගුරු පුහුණුවලට අමතරව පසුගිය කාලෙ 'මොඩියුලර්' කියලා ජාතියක් තිබුණා. ඒවායින් සිද්ධ වුණේ අධ්‍යාපනයට අදාළ දැනුම මනෝවිද්‍යාත්මකව, ජීව විද්‍යාත්මකව, සාමාජයීයව, ආර්ථිකමය වශයෙන්, ආගමික වශයෙන් මේ අයට ලබාදෙන එක. ඒවායින් දියුණු වෙච්ච අයට තමයි ගුරුවරු විදිහට ඊළඟ ශ්‍රේණිවලට යන්න පුළුවන්කම තිබුණේ.

ලංකාවෙ විභාග ගැන ලෝකයෙ තිබුණේ හොඳ ප්‍රතිචාරයක්. ශිෂ්‍යත්ව විභාගය නෙවෙයි අපි මේ කියන්නෙ. ශිෂ්‍යත්ව විභාගය ඉවත් කරන්න ආපු අලුත් ආණ්ඩුව තවම ශිෂ්‍යත්ව විභාගය අයින් කරන්න කටයුතු කරලා නෑ. ඒකට හේතුව මම හිතන්නෙ ඒ වැඩේ කරන එක ලේසි නැති නිසා. 'කියන්න නම් පහසුයි, කරන්න අපහසුයි' කියන එක දැන් අපිට ඉතා පැහැදිලිව පේනවා. මොකද ශිෂ්‍යත්ව විභාගය තවදුරටත් ඉවත් කරන්න බැරි බව පේන්න තියෙනවා.

ශිෂ්‍යත්වය ගැන අපි කතා නොකර ඉමුකෝ. ශිෂ්‍යත්වය අයින් කළත් නැතත් ඒක ඔවුන්ගේ වැඩක්. කරන්න පුළුවන් නම් කරන්න, බැරි නම් ඒකට කමක් නෑ. කිව්ව නිසා කරන්නත් ඕනෙ හරි නම්. අපි ඕවා දන්නෙ නෑ.

ජාතික අධ්‍යාපනයට මේ වෙලාවේ වෙලා තියෙන දේ ගැන විවිධ තැන්වල විවිධ මට්ටම්වලින් කතාබහ කරනවා. අපිට මේ අවස්ථාවේ කතා කරන්න තියෙන ඉතාමත් කනගාටුදායක කාරණා කිහිපයකුත් තියෙනවා. එකක් තමයි මේ සාමාන්‍ය පෙළ ප්‍රතිඵලවල ජයග්‍රහණ පිළිබඳ නිල වශයෙන් නිවේදනය නොකිරීම. මේ හරහා රට තුළ විශාල මතයක් නිර්මාණය කරමින් ඉන්නවා මේකෙන් රිදෙන්නේ ටියුෂන් සර්ලට කියලා. ටියුෂන් සර්ලට නෙවෙයි මේකෙන් රිදෙන්නේ ජාත්‍යන්තර මට්ටමට තමන්ගේ නම අරගෙන යන්න පුළුවන්කම තියෙන දක්ෂ දරුවන්ට. මේකෙන් රිදෙන්නේ ඉතා ඉහළ අධ්‍යාපන ගුණාත්මක බවක් පෙන්වන පාසල්වලට.

අපි දන්නවා ලංකාවට තමන්ගේ ජයග්‍රාහී අංකය කියලා සතුටු වෙන්න පුළුවන් පාසල් කිහිපයක් තියෙනවා. ඒ කියන්නේ පළමුවැනියා තමන්ගේ පාසලේ, දෙවැනියා තමන්ගේ පාසලේ කියලා ඒ නම පත්තරවල යද්දි ඒකෙන් උදම් වෙන්න පුළුවන් පාසල් කිහිපයක් තියෙනවා. ඒ වගේම ලංකාවේ පළමුවැනියා වෙච්ච දරුවාට මේකෙන් වෙන අසාධාරණය කොච්චරද කියන එක ගැන කිසි කෙනෙක් කතා කරන්නේ නැහැ. මොකද මේ සාමාන්‍ය පෙළ විභාග යේ ලංකාවේ පළමුවැනියෙක් ඉන්නවා. ඒ දරුවාවත් අඩුම තරමේ දන්නේ නැහැ තමන් ලංකාවේ පළමුවැනියා කියලා, ඒ දරුවාගේ දෙමවුපියෝවත් දන්නේ නැහැ. ඒ දරුවා ගැන කිසි කෙනෙක් කතා කරන්නේ නැහැ. ගිය අවුරුද්දේ ලංකාවේ පළමුවැනියා ගැන කතා කළා. මේ අවුරුද්දේ ලංකාවේ පළමුවැනියා ගැන කවුරුත් කතා කරන්නේ නැහැ. ඒක බරපතළ තත්ත්වයක්. විවේචනය කරන්න ඕනෙ තත්ත්වයක්.

ඒ අස්සේ උසස් පෙළ ඇවිල්ලා. දහතුන වසරේ තුන්වැනි වාරේ දවස් නවයයි. විභාගය තියෙනවාමයි කියන ස්ථිර අධිෂ්ඨානයෙන් විභාගය තියන්න ලෑස්ති වෙලා ඉන්නවා. මාස 18යි මේ දරුවන්ට ඉස්කෝලේ යන්න ලැබුණේ. පහුගිය ජනවාරි මාසේ ඉස්කෝලේ පටන් ගත්ත ළමයි තමයි මේ වෙලාවේ මේ විභාගය ලියන්න ලෑස්ති වෙලා ඉන්නේ. අඩුම තරමේ මේ දරුවන්ට අවශ්‍ය කරන අධ්‍යාපනයට කාලය වෙන් කරලා දීලා, සිලබස් ටික කවර් කරගන්න ඉඩ දීලා විභාගය තියනවා නම් ඒක ලොකු දෙයක්. දරුවෝ ඉල්ලන්නේ වෙන දෙයක් නෙමෙයි, දරුවන්ට මේ ප්‍රතිඵලය ජීවිතයට බලපානවා. තමන්ගේ ප්‍රතිඵලය මත තමයි තමන්ගේ අනාගතය තීරණය වෙන්නේ.

දැන් මේ වෙනකොට, ඒ කියන්නේ මේ ලිපිය ලියන දවස වෙනකොට ළමයින්ගේ විශ්වවිද්‍යාලවල කටෝෆ් මාර්ක් එක එළියට ඇවිල්ලා නැහැ. ඒ වගේම රී-කරෙක්ෂන් දාපු ළමයින්ගේ ප්‍රතිඵල සටහන ඇවිල්ලා නැහැ අඩුම තරමේ. එතකොට රී-කරෙක්ෂන් දාපු ළමයා විභාගයට ලෑස්ති වෙන්නේ තමන්ගේ ප්‍රතිඵලය නිවැරදි වෙලා එනවද කියලා නොදැන. මේ ලිපිය ලියන දවස වෙනකොට තව තියෙන්නේ මාසයකුයි දවස් කීපයයි. තවම රී-කරෙක්ෂන් ප්‍රතිඵලය එළියට ඇවිල්ලා නැහැ. අඩුම තරමේ රී-කරෙක්ෂන් ප්‍රතිඵලයක්වත් එළියට එන්නේ නැතුව ගියොත් බැරි වෙලාවත් ඒක නම් බරපතළම තත්ත්වයක් වෙනවා. අපි විශ්වාස කරනවා විභාගයට හෙටයි අනිද්දයි කියලා රී-කරෙක්ෂන් ප්‍රතිඵලය නම් නිකුත් වෙයි. නමුත් රී-කරෙක්ෂන් ප්‍රතිඵලයත් එළියට ඇවිල්ලා සෑහෙන කාලයක්නේ දරුවන්ට දෙන්න ඕනේ. සමහර ළමයි ඉන්නවා රී-කරෙක්ෂන් ප්‍රතිඵලය මත තමන්ගේ ජීවිතය වෙනස් වෙයි කියලා බලාපොරොත්තු තියාගෙන තවම පාඩම් කරන්නේ නැතුව හිත හදාගෙන ඉන්න ළමයි.



ජීවන පහන් තිළිණ

විභාගය කියලා කියන්නේ සෙල්ලමක් නෙමෙයි. විභාගය කියලා කියන්නේ කාගෙවත් අතකොලුවක් නෙමෙයි. විභාගයට නිසි කාලය දෙන්නේ නැතුව මේක අපි නිවැරදි කළා, ඔන්න අපි හැරෙව්වා, ඔන්න අපි හරි පැත්තට ගත්තා කියලා කියන එකෙන් වෙන්නේ දරුවන්ගේ මානසික මට්ටම කඩාගෙන වැටෙන එක. අධ්‍යාපනයට මොඩියුලර් ක්‍රම ඉවත් වීම්, ඒ වගේම අධ්‍යාපනයට විවිධ අලුත් ක්‍රම හඳුන්වා දීම් ඇත්තටම සාර්ථක දේවල් බව අපි පිළිග න්නවා.

අපි දන්නවා මේ වෙනකොට ලංකාවේ එකේ පන්තියේ ළමයින්ට උගන්වන ක්‍රමය වෙනස්. හයේ පන්තියට අලුතෙන් එන්න යන්නේ වෙනස් ක්‍රමයක්. එකේ පන්තියේ ළමයින්ගේ ක්‍රමය වෙනස් කරලා ඒ ළමයින්ට හුගක් වරප්‍රසාද ලැබුණා කියලා අපි හිතාගෙන හිටියට ඒගොල්ලන්ට ලැබුණු දෙයක් නැහැ කියලා තමයි දැනෙන්නේ. දැන් අලුතින් හඳුන්වලා දීලා තියෙන ක්‍රමය හරහා මේ දරුවෝ හැන්දෑවට ඇවිල්ලා අරවා හොයනවා, මෙව්වා හොයනවා, මී වද හොයනවා, වඩුකුරුලු කූඩු හොයනවා, ඒ අස්සේ රංකුඹල් ගෙවල් හොයනවා, රබර් ඇට හොයනවා. මේවා හැම තැනම තියෙනවද හැන්දෑවට අරගෙන එන්න? පහුදා උදේට ගේන්න කිව්වම කොහොමද හොයාගන්නෙ? ඉතින් මෙවැනි දේවල් එක්ක මේ පාසල් අධ්‍යාපනය විහිළුවක් වෙලා නිකන් සෙල්ලමක් බවට පත් වුණොත් ඒක භයානකයි. අපි දන්නවා මේ ආණ්ඩුවට ඕනෙ මේක හරි ට්‍රැක් එකට ගේන්න. ලෝකේ ගොඩක් රටවල් ට්‍රැක් එකට මේක ගෙනල්ලා තියෙන්නේ. ඒවා හරි. හැබැයි ගේන්න කරන්න ඕනෙ පිළිවෙළ නිවැරදිව අවබෝධ කරගත්තේ නැත්නම් අපිට බරපතළ ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙනවා. මේ විභාග ප්‍රතිඵල, ඒ-ලෙවල් තියෙන දවස් මේ හැමදේම ඒකට උදාහරණ.

> **“ විභාගයට නිසි කාලය දෙන්නේ නැතුව මේක අපි නිවැරදි කළා, ඔන්න අපි හැරෙව්වා, ඔන්න අපි හරි පැත්තට ගත්තා කියලා කියන එකෙන් වෙන්නේ දරුවන්ගේ මානසික මට්ටම කඩාගෙන වැටෙන එක. අධ්‍යාපනයට මොඩියුලර් ක්‍රම ඉවත් වීම්, ඒ වගේම අධ්‍යාපනයට විවිධ අලුත් ක්‍රම හඳුන්වා දීම් ඇත්තටම සාර්ථක දේවල් බව අපි පිළිගන්නවා.**

## න්දන ශ්‍රීගේ කැබිනෙට්ටුව

### බලතල ඇත්තො බීරි අලි වෙති යසට

වනසනු එපා ලංචිම කිය කිය ඉඳලා
පසෙකට වී නගරෙ අධිපතිකම ලබලා
සිදුවන සියලු දෑ අද හරියැයි කියලා
තුටුවනු පෙනේ දිව දෙක එළියට දමලා

ගෙන ආ වැරදි මග ගල් අඟුරක් හන්දා
රටටම ලැබුණි අපමණ ලෙස නවනින්දා
ජනතාවම රටේ අන්තයටම අන්දා
යහපත නැත රටට අමනවු වැඩ හින්දා

රෝහල් හැදූ අයට ගරහා ඉහළ පෙළේ
'මරමු... මරමු' යන මතයකි සපථ කළේ
මේ අය අහෝ පසුගියදා මොකද කළේ
රෝහල් කාමරය ජනයා නමට හලේ

එක මණ්ඩලය අද ඇත හයකට බෙදලා
දැනටම තිබේ රට ගන අඳුරක හෙළලා
සිටියදි විරුදු පස තුළ වැදි බණ දෙසලා
රජ උරුමය බිඳී තැන තැන විස කවලා

මේ වැනි බොළඳ වැඩ කෙරුවා මිස රටට
දැනෙනා කිසි දෙයක් සිදුකර නැති බවට
ජනයා නගන හඬ පැතිරෙන විට තදට
බලතල ඇත්තො බීරි අලි වෙති යසට

## විසාකා කේශකල්‍යාණි 2026



සිඩාලේප විසාකා කේශකල්‍යාණි 2026, පසුගිය 24 වැනිදා ගල්කිස්ස සිඩාලේප අනර්වා හෝටල් පරිශ්‍රයේ දී අතිඋත්කර්ෂවත් අන්දමින් පැවැත්වුණි. ශ්‍රී ලාංකීය කාන්තාවන්ගේ පිරිපුන් නීරෝගී වරලස ඉස්මතු කරමින්, අගයමින්, ඔවුන් දිරිගැන්වීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධාන කරන ලදී. වසර 90කට අධික කාලයක් පුරාවට ශ්‍රී ලාංකීය ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ පාරිභෝගිකයන්ගේ විශ්වාසය දිනාගත් ආයුර්වේද නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සමාගමක් වන සිඩාලේප සමූහ ව්‍යාපාරයේ සන්නාමයක් වන ''විසාකා'' යනු 'සෑම දිනකම දිදුලන රහස' ලෙස කාන්තා පිරිමි භේදයකින් තොරව පාරිභෝගිකයන් අතර ප්‍රචලිත විශ්වාසදායී ආයුර්වේද නිෂ්පාදන සන්නාමයකි. එය සබන් සහ ෂැම්පූ ලෙස නිෂ්පාදන පෙළකින් සමන්විත වේ. 1983 වර්ෂයේදී දිවංගත සහස්‍රාභිෂේක වෛද්‍යශූරී දේශබන්දු ආයුර්වේද වෛද්‍ය ආචාර්ය වික්ටර් හෙට්ටිගොඩ මැතිතුමා, විසාකා සබන් හඳුන්වාදීම සිදුකරනු ලැබූ අතර එය දෙහි, උළුහාල්, කීකිරිඳිය, කෝමාරිකා, කොහොඹ, සහ පොල්තෙල් යන ඖෂධ වර්ග සමග පාරම්පරික ආයුර්වේද කසාය සහ චූර්ණ අනුසාරයෙන් නිෂ්පාදනය කර ඇත. විසාකා සබන් සමෙහි වියළි බව නැතිකර, තෙතමනය රැකදී, මෘදු, පෝෂණීය සත්කාරයක් ලබාදෙයි. ආයුර්වේද දෙපාර්තුමේන්තුවේ ලියාපදිංචි ආසියාවේ ප්‍රථම ආයුර්වේද සබන් කැටය ලෙස විසාකා සබන් හඳුන්වා දිය හැක.

ප්‍රියන්ත හෙට්ටිගේ





## මිනිසෝටා පෙරපාසලේ පොසොන් දන්සල සහ බැති ගී සරණිය

රත්ගම ප්‍රාදේශීය සභාවට අයත් රත්ගම මොන්රෝවියා වත්ත කටුපොල් කැල්ල මිනිසෝටා පෙරපාසලේ පොසොන් දන්සල සහ පොසොන් බැති ගී සංදර්ශනය පසුගියදා පැවැත්විණි.

රත්ගම ප්‍රාදේශීය සභාවේ සභාපති පී.එච්. දුලාජ් තරංග මහතා ඇතුළු පිරිසක් එම අවස්ථාවට සහභාගි විය.

පෙරපාසලේ පාලිකා එස්.ඩබ්ලිව්. සඳමාලී, පී.ඩී. මධුරි ප්‍රියදර්ශනී මහත්මීන් සහ මවුපියන් විසින් මෙම වැඩසටහන සංවිධාන කර තිබිණි.



එම්.ජී. මලිඳු ප්‍රසන්න මෙන්ඩිස් - රත්ගම




මව්රට
ලිපිනය නො: 22, ජයරත්න මාවත, කොළඹ 05
කර්තෘ මණ්ඩලය 0112505134
ඊමේල් news@mawratanews.lk
වෙබ් අඩවිය www.mawratanews.lk
බෙදාහැරීම් 0764 449 688
දැන්වීම් 0114870063

උපුල් ජෝෂප් ප්‍රනාන්දුගේ

## ගුරුදු විග්‍රහය



# හොරු සහ බොරු

**විජයදාස රාජපක්ෂ පළමු වරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ එක්ව හදපු එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන්ය. එම සන්ධානයේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ලැයිස්තුවට විජයදාසගේ නම ඇතුළත් වන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ලේකම් සුසිල් ප්‍රේමජයන්ත් සහ ජනතා විමුක්ති පෙරමුණේ ලේකම් ටිල්වින් සිල්වාගේ එකඟත්වයෙනි. එදා විජයදාස හිටියේ එක්සත් ජනතා නිදහස් සන්ධානය හදලා ජවිපෙ එක්ක එකතු වෙන්න ඕනෑ කියපු මංගලගේ ටීම් එකේය. ඒ සන්ධානය හදන්න ටිල්වින්, විමල් වීරවංශ, අනුර දිසානායක එක්ක වැඩ කළේ විජේදාස, ශ්‍රීපති සහ මංගලය.**

ඊළඟට 2005 ජනාධිපතිවරණයට මහින්ද එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂක වනවිට විජයදාස, ටිල්වින්, අනුරලා පමණක් නොව චම්පික රණවකලාත් හිටියේ එකටය. මහින්ද ජනාධිපති අපේක්ෂක වීමට පෙර යූ.ඇන්.පී.ය එවක අගමැති ලෙස සිටි මහින්දට එරෙහිව බරපතළ දූෂණ චෝදනාවක් ඉදිරිපත් කළේය. එනම් සුනාමි සහනාධාර ලෙස ලැබුණු මුදල් මහින්ද පෞද්ගලික බැංකු ගිණුමක තැන්පත් කිරීමය. එකල යූ.ඇන්.පී. මන්ත්‍රී වර්තමාන සමගි ජන බලවේග සභාපති කබීර් හෂීම්ය. එවක ජනාධිපති චන්ද්‍රිකා මහින්දට ලිපියක් ලියමින් මෙය බරපතළ වංචාවක් බව සඳහන් කළාය. ලංකා ඉතිහාසයේ පළමු වරට එකම පක්ෂයක ජනාධිපතිවරයෙක් අගමැතිවරයෙකුට දූෂණ චෝදනා ඉදිරිපත් කළ ප්‍රථම අවස්ථාව එය විය.

'එතකොට දූෂණ චෝදනා ලද මහින්දට සහාය දෙන්න බැහැ කියලා ජේ.වී.පී. එක අයින් වුණාද...?'

නැත. ජවිපෙ චන්ද්‍රිකාත් යූ.ඇන්.පී.යත් ඉදිරිපත් කළ හම්බන්තොට සුනාමි වංචාව මහින්ද අපේක්ෂකයා වීම වළක්වන්න කරපු කුමන්ත්‍රණයක් කියා චන්ද්‍රිකාත් යූ.ඇන්.පී.යත් මහින්දට එල්ල කළ සුනාමි චෝදනාවලින් මහින්දව බේරාගත්තේය. එතැන විජයදාසත් සිටියේය.

'අපි පිරිසිදු පක්ෂයක්. අපි දූෂිත මහින්දට සහාය දෙන්නේ නැහැ...'

> **නැත. ජවිපෙ චන්ද්‍රිකාත් යූ.ඇන්.පී.යත් ඉදිරිපත් කළ හම්බන්තොට සුනාමි වංචාව මහින්ද අපේක්ෂකයා වීම වළක්වන්න කරපු කුමන්ත්‍රණයක් කියා චන්ද්‍රිකාත් යූ.ඇන්.පී.යත් මහින්දට එල්ල කළ සුනාමි චෝදනාවලින් මහින්දව බේරාගත්තේය. එතැන විජයදාසත් සිටියේය. 'අපි පිරිසිදු පක්ෂයක්. අපි දූෂිත මහින්දට සහාය දෙන්නේ නැහැ...'**

### ජවිපෙ මහින්දව දිනවපු හැටි

එදා ටිල්වින්ලා අනුරලා මෙහෙම කිව්වා නම් ලංකාවේ දූෂිත දේශපාලන ඉතිහාසය මෙහෙම ලියවෙන්නේ නැත. මහින්දව වීරයෙක් කොට ජනාධිපති පුටුවේ වාඩිකරවපු විජයදාසලා මහා නීතිඥයන් කොට අත්පොළසන් දුන්න ජවිපෙ අද මහින්දගේ හොරකම් පසුපස පැන්නීමත්, විජයදාසගේ පුතාගේ කප්පම් පසුපස පැන්නීමත් දෛවෝපගත සිද්ධියකි. අද ජවිපෙ විසින් හිරේට දමා අත්පුඩි ගසන බොහෝ දේශපාලනඥයන් 2004 ජවිපෙ ඡන්දවලින් පාර්ලිමේන්තුවට තේරී පත්වුණේය. මහින්දානන්ද අලුත්ගමගේ, සරණ ගුණවර්ධන, විජයදාස රාජපක්ෂ යන හැම දේශපාලනඥයෙක්ම 2004 මන්ත්‍රීවරු වුණේ ජවිපෙ ඡන්දවලින්ය. ඇමැතිවරු වුණේ 2005 ජවිපෙ මහින්දව ජනාධිපති කළ නිසාය. ඔවුන්ව පරාජය කරන දේශපාලනය කළේ එක්සත් ජාතික පක්ෂයය. එජාපයට එවැනි ඉතිහාසයක් තිබිණි. ඒත් රනිල් සහ එජාපය රාජපක්ෂ පවුලෙන් ජනාධිපතිකම ගෙන රාජපක්ෂ ආණ්ඩුවේ දූෂිත ඇමැතිවරු ආරක්ෂා කරන්න ගිහින් ඒ ඉතිහාසයේ මඩ ගාගත්තේය.

සජිත්ගේ සමගි ජන බලවේගය ඒ මඩවලින් බේරුණි. සජබය ලංකාවේ හොරකමට එරෙහිව අලුත් දේශපාලන සංස්කෘතියක් හදපු පක්ෂයකි. කෙහෙළිය රඹුක්වැල්ලගේ බෙහෙත් වංචාවට එරෙහිව පාර්ලිමේන්තුවේ විශ්වාසභංග යක් ගෙන ආවේ සජබයය. ඒ වෙලාවේ විපක්ෂයේ සිටි ජවිපෙ ඒ විශ්වාසභංගයට හිනාවිය. පරදින්න විශ්වාසභංග ගෙනැවිත් ආණ්ඩුව ශක්තිමත් කරනවා කියා සජබයට ඔච්චම් කළේය. සජබය කෙහෙළියට එරෙහිව විශ්වාසභංගය ගෙනැවිත් පරාජය විය. වැඩි කලක් ගියේ නැත. කෙහෙළියගේ බේත්වලින් ලෙඩ්ඩු අසාධ්‍ය වූ විට සජබය කෙහෙළියට එරෙහිව ඉදිරිපත් කළ චෝදනා ඇත්ත බව ඔප්පු විය. අවසානයේ කෙහෙළියව ආරක්ෂා කරගන්න විශ්වාසභංගයට එරෙහිව දෑත් ඔසවපු රනිල්-රාජපක්ෂ ආණ්ඩුවට කෙහෙළියව ඇමැති ධුරයෙන් ඉවත් කොට හිරේ දමන්න සිදුවිය. ඊට පස්සේ ජවිපෙ වේදිකා දෙවනත් කරන්න පටන් ගත්තේය.

රට බංකොළොත් කිරීමේ වරදට රාජපක්ෂවරුන් වගකිව යුතුය යන චෝදනාව උසාවියට ගෙන ගියේ සමගි ජන බලවේගයය. ජවිපෙ වේදිකාවල රාජපක්ෂවරුන්ව පතුරු ගහ ගහ ගියා මිස රාජපක්ෂවරු කරපු වරදට අධිකරණමය ක්‍රියාමාර්ගයක් ගත්තේ නැත. ඒත් සමගි

> **සමගි ජන බලවේගය කුමාර ජයකොඩිට එරෙහිව විශ්වාසභංගයක් ගෙන ආ විට රනිල්-රාජපක්ෂ ආණ්ඩුව සමගි ජන බලවේගය කෙහෙළියට එරෙහිව විශ්වාසභංගය ගෙන ආ වෙලාවේ කෙහෙළියව ආරක්ෂා කළා සේ ජවිපෙ කුමාර ජයකොඩිව ආරක්ෂා කළේය. විශ්වාසභංගයේදී ජවිපෙ ආණ්ඩුවම කුමාර නිර්දෝෂී යැයි කීය. සජබ විශ්වාසභංගය පරාජය විය**

ජන බලවේගය අධිකරණ තීන්දුවකින් ඒ චෝදනාව ඔප්පු කරගත්තේය.

අනුර ජනාධිපති වී ආණ්ඩුවක් හදා පත්කළ කතානායකවරයාගේ උපාධි සහතික ව්‍යාජ බව ඔප්පු වූ විට කතානායකට එරෙහිව විශ්වාසභංගයක් ගෙන එන්න අස්සන් එකතු කර අනුරවත්, ආණ්ඩුවත් අපහසුතාවට පත් කළේ සමගි ජන බලවේගයය. සජබයේ ඒ විශ්වාසභංග තර්ජනය නොවන්න රංවල තවමත් කතානායකය. විදේශ ඇමැති විජිත හේරත්, සෞඛ්‍ය ඇමැති නලින්ද ජයතිස්ස කීවේ රංවල උපාධි සහතික රැගෙන එන තෙක් ඉවත් වූවා කියාය.

අනුරගේ ආණ්ඩුවේ ගල්අඟුරු වංචාව පළමු වරට හෙළිදරව් කළේ සමගි ජන බලවේගයය. සජබ මන්ත්‍රී මරික්කාර් නොසිටින්න තෙල් ඇමැති කුමාර ජයකොඩි තවමත් තෙල් ඇමැතිය. සමගි ජන බලවේගය කුමාර ජයකොඩිට එරෙහිව විශ්වාසභංගයක් ගෙන ආ විට රනිල්-රාජපක්ෂ ආණ්ඩුව සමගි ජන බලවේගය කෙහෙළියට එරෙහිව විශ්වාසභංගය ගෙන ආ වෙලාවේ කෙහෙළියව ආරක්ෂා කළා සේ ජවිපෙ කුමාර ජයකොඩිව ආරක්ෂා කළේය. විශ්වාසභංගයේදී ජවිපෙ ආණ්ඩුවම කුමාර නිර්දෝෂී යැයි කීය. සජබ විශ්වාසභංගය පරාජය විය. ඒත් ජවිපෙ ආණ්ඩුවට කුමාර ජයකොඩිව ඇමැති ධුරයෙන් ඉවත් කරගැනීමට සිදුවිය. එදා සජබය විශ්වාසභංගයක් ඉදිරිපත් නොකළා නම් තවමත් තෙල් ඇමැති කුමාර ජයකොඩිය.

කුමාර ජයකොඩි ඇමැති ධුරයෙන් ඉවත් වූවාට තවම මන්ත්‍රීය. රංවල කතානායක ධුරයෙන් ඉවත් වූවාට තවම මන්ත්‍රීය. ආණ්ඩුවේ ප්‍රබලතම ඇමැතිවරයෙක් වූ වසන්ත සමරසිංහ, නියෝජ්‍ය ඇමැති මහින්ද ජයසිංහට එරෙහි චෝදනා අධිකරණයේ අසමින් තිබේ.

'හරක් කටාගේ කප්පම් චෝදනාවට හසුවූ චරිත් අබේසිංහට එරෙහිව විපක්ෂ නායකතුමා ගන්නා පියවර කුමක්ද...?'

චරිත් අබේසිංහ අත්අඩංගුවට පත්වූ වෙලාවේ ආණ්ඩුව සමච්චලයට මෙන් සජිත්ගෙන් ඇසීය.

### දූෂණයට එරෙහිව සජිත් කරපු සටන


'කිසිදු සැකයක් නැහැ. වරදක් කර ඇත්නම් අපි විනය පියවර ගන්නවා...'

සජිත් පැහැදිලිව උත්තර දුන්නේය.


රංවල සම්බන්ධයෙන්, කුමාර ජයකොඩි සම්බන්ධයෙන්, වසන්ත, මහින්ද සම්බන්ධයෙන් ජවිපෙට ඒ උත්තරය දෙන්න පුළුවන්ද?

ඔවා දෙනු පරහට - තමා සම්මතයේ පිහිටා සිට කියන්නේ ඕකටය.

උපුල් ජෝශප් ප්‍රනාන්දු







### ලොකු ජයග්‍රහණයක්

# ලංකාවේ දළ ඇත්තු 300 පැන්නුවා




**මෙරට වනජීවීන් වෙනුවෙන් කැපවෙන පිරිස ඉතාමත් සීමිතයි. එයිනුත් අලි ඇතුන් වෙනුවෙන් හා ඔවුන්ගේ සංරක්ෂණය වෙනුවෙන් එකතු වන කණ්ඩායමක් තමන්ගේ ගමන් මගේ එක් සුවිශේෂ සන්ධිස්ථානයකට පැමිණ තිබෙනවා. වයිල්ඩ් ටස්කර්ස් ශ්‍රී ලංකා සංවිධානය පසුගිය සතිය වනවිට මෙරට සිටින ඇතුන්ගේ නාමකරණයේ 300 වැනි කඩඉම පසු කළා. විද්‍යාත්මක හා පර්යේෂණාත්මක තොරතුරු මත පදනම්ව ඡායාරූප හා අනෙකුත් ජෛව විද්‍යාත්මක කරුණු උපයෝගී කරගෙන සිදුකරනු ලබන ඇතුන් නාමකරණය හා වයිල්ඩ් ටස්කර්ස් ශ්‍රී ලංකා සංවිධානයේ දශකයක ගමන් මග ගැන 'කැලෑ කොළම' සමග අද සම්බන්ධ වෙන්නේ එම සංවිධානයේ සම්බන්ධීකාරක චන්දික ලක්මාල් සහෘදයා.**

වසර දහයක් පුරා අප සමූහය පැමිණි ගමන් මගේ අද තවත් සන්ධිස්ථානයක් ලකුණු කිරීමට සමත් වීම ගැන අපි නිහතමානීව ආඩම්බර වෙනවා. වයිල්ඩ් ටස්කර්ස් ශ්‍රී ලංකා, ශ්‍රී ලංකාව තුළ පසුගිය දශක හතරක කාලය තුළ සිට මේ දක්වා 300 වැනි දළ ඇතා හඳුනාගෙන ලේඛනගත කිරීමට අපි සමත් වුණා. මෙය හුදෙක් සංඛ්‍යාත්මක ජයග්‍රහණයක් පමණක් නොවෙයි. එය වසර දහයකට ආසන්න කාලයක් පුරා නොසැලෙන කැපවීමකින්, කිසිම පුද්ගලික අරමුණුවලින් තොරව, මුදල් ඉපයීමේ අභිලාෂයෙන් තොරව, වියළි කලාපීය වනාන්තර, වගාබිම්, වැව්පිටි තුළ ගතකරන ලද පැය දහස් ගණනක හා අසීමිත නිරීක්ෂණයන් තුළින් ලබාගත් සාමූහික ජයග්‍රහණයක්.

මේ ගමන ආරම්භ වූයේ 2016 වසරේ වනජීවී ඡායාරූපකරණයට හා දළ ඇතුන්ට දැඩි ආදරයක් තිබූ කුඩා පිරිසක් එකම අරමුණක් වෙනුවෙන් එක්වීමෙන්. ඔවුන්ගේ අරමුණ වූයේ ලංකාව පුරා සිටින දළ ඇතුන් හඳුනාගෙන ඔවුන්ගේ සංචරණ රටා, වයස, වාසභූමි හා වෙනත් වැදගත් තොරතුරු සටහන් කරමින් පර්යේෂණයටත් සංරක්ෂණයටත් ප්‍රයෝජනවත් වන දත්ත පද්ධතියක් ගොඩනැගීමයි. ආරම්භයේදී ඉතා සීමිත දත්ත ප්‍රමාණයකින් පටන්ගෙන ලැබෙන සෑම ඡායාරූපයක්ම ඉතා ප්‍රවේශමෙන් නිරීක්ෂණය කොට විශ්ලේෂණාත්මකව නූතන විද්‍යාත්මක දළ ඇතුන් හඳුනා ගැනීමේ ක්‍රමවේදයන්ට අනුව ක්‍රමානුකූලව මෙම දත්ත පද්ධතිය ගොඩනගා ගැනීමට අපට හැකි වුණා.

කාලයත් සමග සාමාජික සංඛ්‍යාව ක්‍රමයෙන් විශාල වීමත් සමග දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම වනජීවී ඡායාරූප ශිල්පීන්, පර්යේෂකයන්, සොබාදහමට හා වනසතුන්ට ආදරය කරන පිරිස්, වනෝද්‍යාන නරඹන්නන් සහ සංරක්ෂණයට කැපවූ පුද්ගලයන් අප සමූහය සමග එක්වී ආරම්භ වූ මෙම ගමන අද වනවිට ලංකාවේ දළ ඇතුන් හඳුනා ගැනීම සහ නිරීක්ෂණය කිරීම වෙනුවෙන් කැපවූ සහ විශාලම දත්ත පද්ධතිය හිමි සාමූහික ජාලය බවට පත්ව ඇත. එය සැබවින්ම ආඩම්බරයට කරුණක්.

මුල් කාලයේදී අප හට පැවැති ප්‍රධානම අභියෝගය වූයේ දළ ඇතුන්ගේ විස්තර හා ඡායාරූප සමාජගත වීම ඔවුන්ගේ ජීවිතවලට තර්ජනයක් බවට ජනතාව තුළ පැවැති වැරදි අවබෝධයයි. කාලයත් සමග තොරතුරු තාක්ෂණයේ සිදුවූ දියුණුවත් සමග එම මතය නිවැරදි නොවන බවට ජනතාවට තේරුම් කර දීමත්, වර්තමානයේ දළ ඇතුන්ගේ ආරක්ෂාව පවතින්නේ ඔවුන්ගේ අනාවරණය වීම තුළ බවත් හේත්තු ගැන්වීමට හැකිවීම අප ලැබූ සාමූහික ජයග්‍රහණයක්.

අද අපි අභිමානයෙන් 300 වැනි දළ ඇතා හඳුනා ගැනීම වෙනුවෙන් මෙම සටහන තැබුවත් පහතින් දැක්වෙන්නේ මෙම දස වසරක කාලය තුළ අප සමූහය විසින් ශ්‍රී ලංකා භූමිය තුළ වාසය කරන ලද සියලු අලි ඇතුන් සංරක්ෂණය වෙනුවෙන්, අලි - මිනිස් ගැටුමෙන් පීඩාවට පත් සහෝදර ගම්වැසියන්, දූ දරුවන් හා අනාගත පරපුර වෙනුවෙන් අප සමූහය විසින් ස්වේච්ඡාවෙන් සිදුකරනු ලැබූ කාර්යයන්ගෙන් කීපයක් පමණයි.

අපගේ මුල්ම සාර්ථකම ව්‍යාපෘතිය වූයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග එක්ව කලාවැව ජාතික වනෝද්‍යානය සඳහා දළ ඇතුන් හඳුනා ගැනීමේ මාර්ගෝපදේශය සකස් කිරීමයි. අද එය වනජීවී ඡායාරූප ශිල්පීන්ට, මාර්ගෝපදේශකයන්ට, පර්යේෂකයන්ට සහ වනෝද්‍යාන පැමිණෙන්නන්ට, අමුත්තන්ට ඉතා වටිනා මාර්ගෝපදේශයක් වී තිබේ. සංරක්ෂණය වනජීවී උද්‍යානයන්ට පමණක් සීමා නොවන බව අප විශ්වාස කරමු. ඒ නිසා අලි - මිනිස් ගැටුමෙන් සෘජුවම පීඩාවට පත්වෙන කලාවැව අවට දරුවන්ට පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහන් අපි නිරන්තරයෙන් ක්‍රියාත්මක කළෙමු. අධ්‍යාපනය හා දැනුවත් කිරීම අපගේ මූලික අරමුණුවලින් එකක් වන අතර, අලි - මිනිස් ගැටුම බරපතළව පවතින ප්‍රදේශවල වෘත්තිකයන්, ප්‍රාදේශීය ජනතාව සහ පාසල් දරුවන් ඉලක්ක කරගනිමින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ මාලා රැසක් සංවිධාන කළෙමු. අනාගත පරපුර තුළ සංරක්ෂණය පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇති කිරීම එහි ප්‍රධාන අරමුණ විය.

එමෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ පණ්ඩුලගම පශු වෛද්‍ය ඒකකය සමග එක්ව අලි සහ දළ ඇතුන් බේරාගැනීමේ මෙහෙයුම් රැසකටද ක්‍රියාකාරීව දායක වීමටද අපට හැකි විය. තවද වැදගත් සංරක්ෂණ කටයුත්තක් වූයේ කලාවැව තෘණ භූමි ප්‍රතිස්ථාපන ව්‍යාපෘතියයි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, පළාත් පාලන ආයතන, ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන, ජනාධිපති ලේකම් කාර්යාලය, ත්‍රිවිධ හමුදාව හා අපේ රටේ සෑම ප්‍රදේශයකින්ම පැමිණි සියදහස් ගණනක් පරිසරයට හිතැති මහජනතාවගේ අනුග්‍රහයෙන් කලාවැව තුළ අලි ඇතුන්ගේ සාම්ප්‍රදායික තෘණ භූමි ආක්‍රමණය කර තිබූ ජපන් ජබර ඉවත් කිරීමේ තෙදිනක දැවැන්ත වැඩසටහනක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට අපට හැකි විය. එමගින් අලි ඇතුන්ට සහ අනෙකුත් වනජීවීන්ට අවශ්‍ය ආහාර භූමි ප්‍රතිස්ථාපනය කිරීම වැදගත් පියවරක් විය. එහි අනගි ප්‍රතිඵල මේ වනවිට අලි ඇතුන් සහ අනෙකුත් සතුන් භුක්ති විඳිනු දැකීමට හැකි වීම සතුටට කරුණකි.

මෑතකදී අප ලැබූ තවත් සුවිශේෂ අවස්ථාවක් වූයේ ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාරය සමග එක්ව පසුගිය දශක හතරක කාලයක් ශ්‍රී ලංකාවේ වනාන්තර තුළ සැරිසැරූ, අදටත් සැරිසරන තේජවන්ත දළ ඇතුන්ගේ ඡායාරූප ප්‍රදර්ශනයක් Legends of the Wild නමින් සංවිධාන කිරීමයි. මෙම ප්‍රදර්ශනය මගින් දළ ඇතුන්ගේ අලංකාරය පමණක් නොව ඔවුන්ගේ දුර්ලභත්වය, පාරිසරික වටිනාකම සහ සංරක්ෂණයේ වැදගත්කම ද ජනතාවට ඒත්තු ගැන්වීමට අපට හැකි විය.

මීට අමතරව පහත සඳහන් ව්‍යාපෘතිවලටද අප සමූහයෙන් දායකත්වය දක්වා ඇත.

- අප රට තුළ දැනට ජීවත් වන විශාලම දළ ඇතෙකු ලෙස සැලකෙන 'කාවන්තිස්ස' ඇතාගේ ආරක්ෂාව සඳහා එම ප්‍රදේශයේ තරුණ ප්‍රජාව සංවිධාන කරන මහජන දැනුවත් කිරීම් වැඩසටහන්වලට දායකත්වය දැක්වීම.
- කොළඹ කුරුඳුවත්ත රොටරි සමාජය හා එක්ව අලි - මිනිස් ගැටුමෙන් පීඩාවට පත් ප්‍රදේශ දෙකක අලි වැට සංරක්ෂණය හා ගම්වැසියන් දැනුවත් කිරීමේ කාර්යයන්හි ස්වේච්ඡාවෙන් නිරත වන ගම්වැසියන් දෙදෙනකුට රුපියල් 75,000 බැගින් වන පාපැදි දෙකක් ලබාදීම.

ශ්‍රී ලංකාව තුළ ජීවත් වන අලි ඇතුන් පිළිබඳ අසීමිත ආදරය හා ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කළ යුතුය යන විශ්වාසය පමණක් පෙරදැරි කරගෙන ආරම්භ කළ මෙම සමූහයට මෙතරම් දුරක් පැමිණීමට එම උදාර අරමුණ ආශිර්වාදයක් වූ බව අපි දනිමු. අප විසින් හඳුනාගත් සෑම දළ ඇතෙකුම, සිදුකළ සෑම ක්ෂේත්‍ර චාරිකාවක්ම, සෑම බේරාගැනීමේ මෙහෙයුමක්ම, සෑම දැනුවත් කිරීමේ වැඩසටහනක්ම සහ සෑම සංරක්ෂණ ව්‍යාපෘතියක්ම සාර්ථක වූයේ තම කාලය හා දැනුම ශ්‍රමය නොපිරිහෙළා කැපකළ පිරිසගේ නිහතමානී දායකත්වය නිසාය.

පසුගිය දශකය පුරා මෙම ගමන් මගේ කොටස්කරුවන් වූ වයිල්ඩ් ටස්කර්ස් ශ්‍රී ලංකාවේ සියලු සාමාජිකයන්ට, පරිපාලක මණ්ඩලයට, වනජීවී ඡායාරූප ශිල්පීන්ට, පර්යේෂකයන්ට හා ස්වේච්ඡා සේවකයන්ට සහ අප සමග සිටි සියලු හිතවතුන්ට අපගේ හෘදයාංගම කෘතඥතාව පළකර සිටිමු. තවද හඳුනා ගැනීමට බලා සිටින දළ ඇතුන් බොහෝ දෙනෙක් ලංකාවේ වනාන්තර තුළ සැරිසරති. එසේම තවත් බොහෝ දළ ඇතුන් ප්‍රමාණයක් හඳුනා ගැනීමකින් තොරවම අවසන් හුස්ම හෙළන්නට ඇත. තවත් ආරක්ෂා කළ යුතු වාසස්ථාන බොහොමයක් ඇත. තවත් විසඳිය යුතු සංරක්ෂණ අභියෝග රැසක්ද ඉදිරියේ ඇත. ඉන් ප්‍රධානම එකක් වන්නේ අලි ඇතුන්ගේ සංචරණය සිදුවන අලිමංකඩවල් නිදහස් කිරීමයි. එය සෙමින් සෙමින් වුවත් ක්‍රියාත්මක වීම අගය කළ යුත්තකි.

සමන් හල්ලොලුව

# මෛත්‍රීගේ කාලේ 8යි

# ගෝඨාගේ කාලේ 0යි

# රනිල්ගේ කාලේ 11යි

# අනුරගේ කාලේ දැනට 58යි

# පාතාලේ ඇතුළේ

**පාතාලය දැන් ටික කාලයක සිට නිහඬය. ඒ රටින් පැන ගිහින් පිටරටවල රූඳී සිටිමින් මෙරට වැඩ පෙන්වූ පාතාලයේ වැඩ්ඩෝ යැයි කියන අය බුරුතු පිටින් අල්ලාගෙන මෙරටට ආ බැවිනි. ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා පාර්ලිමේන්තුවට 25 වැනිදා පැමිණ ප්‍රකාශ කළ ආකාරයට මාලිමා ආණ්ඩුව බලයට ආ පසු මෙතෙක් කාලයක් තුළ රතු නිවේදවලට අනුව පිටරටින් අල්ලාගෙන ආ අපරාධකරුවන් ගණන 23කි. ඒ හැරුණු කොට තවත් 35 දෙනෙක්ද ඇතුළුව පිටරටවලින් අල්ලාගෙන ආ අපරාධකරුවන් ගණන 58කි. මේ අතර එක්සත් අරාබි එමීර් රාජ්‍යය මගින් පසුගියදා පිටුවහල් කළ අයද සිටිති.**

රතු නිවේදන නොමැති පිටරටවලින් අල්ලාගත් පාතාල අපරාධකරුවන් 14 දෙනෙක්ම මෙරටට ගෙන ඒමට පසුගිය කාලයේදී හැකිවී ඇත. එම හැකියාව ලැබී ඇත්තේ පොලිස්පති, නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතාට ඒ ඒ රටවල පොලිස් ප්‍රධානීන් සමග ඇති සම්බන්ධකම්ය.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක, සහකාර පොලිස් අධිකාරී උදයකුමාර වුඩ්ලර් මහතා පවසන ආකාරයට තවත් පාතාල අපරාධකරුවන් 95 දෙනකුට ජාත්‍යන්තර පොලිසිය මගින් රතු නිවේදන නිකුත්කර තිබේ. ඒ අයගෙන්ද කිහිප දෙනෙක් මේ වනවිට ඉන්නේ ඩුබායි, රුසියාව, ඉන්දියාව ආදී රටවල් රැසක අත්අඩංගුවේය. ඔවුන්වත් මෙරටට ගෙන්වා ගැනීමට හැම උත්සාහයක්ම පොලිසිය ගනිමින් සිටින්නේ රාජ්‍යතාන්ත්‍රික සහ ජාත්‍යන්තර පොලිස් මෙහෙයුම් හරහාය.

රටින් පැන්න පාතාල අපරාධකරුවන් අල්ලා මෙරටට රැගෙන ඒම අද ඊයේ පමණක් සිදුවූවක් නම් නොවේ. පාතාලයේ වැඩකාරයෝ මෙන්ම අපරාධවල නිරතව රටින් පැන්න කොතෙකුත් පිටරටවලදී අල්ලාගෙන මෙරටට රැගෙන විත් ඇත. ඒ අතර 90 දශකයේ මුල වඩාත් කතාබහකට ලක්වන්නේ ඔස්මන් ගුණසේකර ජපානයේ සිට මෙරටට ගෙන ඒමය. අත්තනගල්ල අධිකරණයේදී විනිසුරුවරයා නඩු අසමින් සිටියදී ගිනි අවියක් අතැතිව අධිකරණ ශාලාවට කඩාවැදී එවක වීරගුල පොලිස් ස්ථානාධිපතිවරයා සහ ඔහුගේ බිරිඳගේ පියාට වෙඩිතබා ඝාතනය කර ජපානයට පැනගත් ඔස්මන් ගුණසේකර අල්ලාගන්නේ එරටින් පිටුවහල් කරගැනීමෙනි. එම මෙහයුම කරනු ලැබුවේ එජාප ආණ්ඩුව පැවැති සමයේදීය. අදටත් ඒ විදිහටම අපරාධකරුවන් අල්ලා ගැනීමේ ජාත්‍යන්තර පොලිස් සම්බන්ධකම් මත කෙරෙන මෙහෙයුම්වල අඩුවක් නැති තරම්ය.

ඔස්මන් ගුණසේකරගෙන් පසු රටේම අවධානයට ලක්වූ පාතාල අපරාධකරුවන් මෙන්ම මත්කුඩු ජාවාරම්කරුවන් පිටරටවලින් අල්ලාගෙන මෙරටට ගෙන්වා ගැනීම් සිදුවූයේ යහපාලන ආණ්ඩුව පැවති කාලයේදීය.

## 2015 - 2019 යහපාලන ආණ්ඩුව (මෛත්‍රී යුගය)



### 01. වෙලේ සුදා

කුප්‍රකට මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන සමන්ත කුමාර හෙවත් 'වෙලේ සුදා' පාකිස්තානයේදී අත්අඩංගුවට ගැනීමෙන් පසු ශ්‍රී ලංකාවට රැගෙන ආවේ 2015 ජනවාරි මාසයේදීය.

2015 ජනවාරි 14 වැනිදා පමණ පාකිස්තාන බුද්ධි අංශ හා ශ්‍රී ලංකා බලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් ඔහුව අත්අඩංගුවට ගෙන තිබුණි. පෙර පැවති ආණ්ඩුවල ප්‍රබලයන් සමග මෙන්ම පොලිස්පතිවරයකු සමග ඉතා කිට්ටු සම්බන්ධකමක් පැවැති වෙලේ සුදා කලක් එක්සත් එමීර් රාජ්‍යයේ මෙරට තානාපති කාර්යාලයේ නිතර දැකිය හැකි චරිතයක් බවට පත්ව තිබුණි.

2008 වසරේදී හෙරොයින් ග්‍රෑම් 7.05ක් සන්තකයේ තබාගැනීමේ චෝදනාවට වරදකරු කරමින් කොළඹ මහාධිකරණය විසින් ඔහුට මරණ දඬුවම ලබාදී ඇත. මේ වනවිට ඔහු වැලිසර පිහිටි විශේෂ රැඳවුම් මධ්‍යස්ථානයේ රඳවා සිටියි.



### 02 මොහොමඩ් සිද්ධික්

ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන මොහොමඩ් මකීන් මොහොමඩ් සිද්ධික් නොහොත් කුඩු සිද්ධික් මෙරට මත්කුඩු ජාවාරමේ අංක එකේ පුද්ගලයෙකි. 2015 මාර්තු 19 වැනිදා පාකිස්තානයේදී අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහුව මෙරටට රැගෙන ආවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කණ්ඩායමක් පාකිස්තානයට ගොසිනි. ඒ, වෙලේ සුදාගේ ඔත්තුවකිනි.

වසර තුනකට වැඩි කාලයක් රක්ෂිත බන්ධනාගාරගතව සිටි සිද්ධික් 2018 සැප්තැම්බර් මාසයේදී කොළඹ මහාධිකරණය විසින් ඔහුට එරෙහිව පැවති කුඩු නඩුවලින් නිදොස් කොට නිදහස් කරන ලදී. පසුව 2019 දී ඔහු ඇප මත මුදාහැරීමෙන් පසු නැවතත් රටින් පලා ගියේය. ඕමානයේදී ඔහු 2023 අවුරුද්දේ අගෝස්තුවේ නැවත කොටුවුවත් මෙරටට භාරදීමක් සිදුවූයේ නැත. ඒ ඔහු සතුව ඒ වනවිට තිබී ඇත්තේ ඉන්දියානු ගමන් බලපත්‍රයක් වූ බැවිනි.



### 03. මාකඳුරේ මධුෂ්

පාතාලයේ ගෝඩ් ෆාදර්වරයෙක් වූ සමරසිංහ ආරච්චිලාගේ මධුෂ් ලක්ෂිත නොහොත් මාකඳුරේ මධුෂ් ඩුබායි සිට මෙරට පාතාල කල්ලි පාලනය කරන්නට වූයේ ඉන්දියාවේ පාතාල රජු ඩාවුඩ් ඊබ්‍රාහිම්ගේ අඩිපාරේ යමිනි.

පොලිස් නිලධාරීන්ට පවා මරණ බිය ගෙනදුන් මධුෂ්ට වැඩ වරදින්නේ සිය දියණියගේ පළමු උපන්දිනය වෙනුවෙන් ඩුබායි හෝටලයක පැවති සාදයකදීය.

2019 අවුරුද්දේ පෙබරවාරි 05 වැනිදා එම හෝටලයේදී මධුෂ් සමග ඩුබායි පොලිසිය තවත් පිරිසක් අත්අඩංගුවට ගත්තේය. ඒ අතර සාදයට සහභාගි වීමට ලංකාවෙන් ගිය කලාකරුවන්ද පාතාල අපරාධකරුවන් රැසක්ද සිටියේය.

2019 අවුරුද්දේ මැයි 05 වෙනිදා ශ්‍රී ලංකාවට පිටුවහල් කළ ඔහුව ඩුබායි සිට රැගෙන එන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කණ්ඩායමකි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වසරකට වැඩි කාලයක් රඳවා සිටියදී ඔහු මත්කුඩු ජාවාරමට සම්බන්ධ දේශපාලනඥයන් රැසක් ගැන තොරතුරුද හෙළි කළේය.

එහි ප්‍රතිඵලයක් ලෙස පොහොට්ටු ආණ්ඩුව පිහිටුවා කෙටි කලකින් කොළඹ අපරාධ කොට්ඨාස භාරයට පත්වූ මාකඳුරේ මධුෂ් පොලිස් අත්අඩංගුවේ සිටියදී නාඳුනන වෙඩික්කරුවකුගේ ප්‍රහාරයකින් මරුමුවට පත්වන්නේ මාලිගාවත්තේ මහල් නිවාස සංකීර්ණයකදීය. ඒ, 2020 ඔක්තෝබර් 20දා අලුයම් කාලයේදීය.



### 04. කංජිපානි ඉම්රාන්

මොහොමඩ් නජීම් මොහොමඩ් ඉම්රාන් නොහොත් කංජිපානි ඉම්රාන් අත්අඩංගුවට පත්වන්නේ මධුෂ්ගේ දියණියගේ උපන්දින සාදයේදීය.

මධුෂ්ගේ ළඟම සගයා වූ මොහු මාලිගාවත්ත ප්‍රදේශය කේන්ද්‍ර කරගත් මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු සහ මිනීමැරුම් රැසක මහමොළකරුවෙකි.

ඩුබායි රාජ්‍යයෙන් ඔහුව පිටුවහල් කරනු ලැබුවේ 2019 මාර්තු 28 වැනිදාය.

මහා පරිමාණයේ මත්කුඩු ජාවාරම්කරුවෙක් වුවත් පොලිසිය ඔහුට නඩු පවරන්නේ ගංජා ළඟ තබාගැනීමක් සම්බන්ධයෙනි.

ඒ සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණය මගින් වසර 6ක බරපතළ වැඩ සහිත සිරදඬුවමක් ඔහුට නියම කළේය. කෙසේ වෙතත්, පසුව ඔහුට එරෙහිව තිබූ නඩුවලින් 2022 දෙසැම්බර් 20 වැනිදා දැඩි ඇප කොන්දේසි මත මුදාහැරීමට අධිකරණය කටයුතු කළේය.

ඇප ලැබුණු ඔහු 2022 දෙසැම්බර් 25 වැනිදා වෙස්වළාගෙන තලෙයිමන්නාරම ප්‍රදේශයෙන් මුහුදු මාර්ගයෙන් ඉන්දියාවේ තමිල්නාඩුවට පැන්නේය.



### 05. රොටුඹ අමිල

සේපාල රත්නායකගේ අමිල සම්පත් නොහොත් රොටුඹ අමිල මෑත කාලයේ නිතර නම කියැවුණු පාතාලයේ ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙකි. මාකඳුරේ මධුෂ්ගේ දියණියගේ උපන්දින සාදයට ගොස් ඔහුද හසුවූ අයෙකි. 2019 මාර්තු 28 වැනිදා කංජිපානි ඉම්රාන් සමගම ඔහුවත් මෙරටට පිටුවහල් කරන ලදී. බන්ධනාගාරගතව කාලයක් සිටි ඔහු ඇප ලැබීමෙන් පසු රටින් පැන්නේය. ඔහු දැන් සිටින්නේ රුසියාවේය. 2025 මාර්තු මාසයේදී රුසියාවේදී එරට ආරක්ෂක අංශ විසින් දේශසීමා පනින්නට ගොස් අත්අඩංගුවට ගෙන ඇති අතර, ඔහු තාමත් සිටින්නේ රුසියානු ආරක්ෂක අංශ භාරයේය.

### 06. කැලුම් ඉන්දික සම්පත් හෙවත් 'ජංගා'

මාතර සිදුවූ කොල්ලකෑම් ඇතුළු අපරාධ රැසකට සම්බන්ධ ජංගාද මධුෂ්ගේ දියණියගේ සාදයේදී හසුවී මෙරටට පිටුවහල්කරනු ලැබූවෙකි.

### 07. කළු සාගර

සාගර රේණුක පෙරේරා නොහොත් කළු සාගර කොළඹ මෝදර සහ මාලිගාවත්ත ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් සංවිධානාත්මක අපරාධ සහ මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම් මෙහෙයවූ ප්‍රබල පාතාල සාමාජිකයෙකි. මධුෂ්ගේ දියණියගේ උපන්දින සාදයේදී කොටුවූ ඔහුවද ඩුබායිවලින් පිටුවහල් කර තිබුණි.

### 08. කළු ප්‍රියන්ත

හෙට්ටිආරච්චිගේ ප්‍රියන්ත නොහොත් කළු ප්‍රියන්ත යනු දකුණු පළාත සහ කොළඹ ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් සංවිධානාත්මක අපරාධවල නිරත වූ, මාකඳුරේ මධුෂ්ගේ කල්ලියේ සිටි තවත් එක් ප්‍රබල සාමාජිකයෙකි. ඔහුවද කොටුවන්නේ මධුෂ්ගේ දියණියගේ උපන්දින සාදයේදීය. ඔහුව ඩුබායිවලින් පන්නා මෙරටට එවන්නේ 2019 අප්‍රේල් මාසයේදීය.

## 2019-2022 පොහොට්ටු ආණ්ඩුව (ගෝඨාභය යුගය)

මේ කාලය තුළ විදේශගත අපරාධකරුවන් අල්ලාගෙන මෙරටට ගෙන ආ බවක් හෝ විදේශගතව සිටින අපරාධකරුවන් ගෙන්වා ගැනීමට කළ උත්සාහයක් ගැන කරුණු අනාවරණ වන්නේ නැත.

## 2022-2024 රනිල් ආණ්ඩුව

### 01. කිරි කොල්ලා

ඇටම්පොල ආරච්චිලාගේ අවිශ්ක මධුසංක හෙවත් කිරි කොල්ලා නැමැත්තා පාතාල වෙඩික්කරුවෙකි. ගම්පහ අධිකරණ සංකීර්ණය ආසන්නයේදී පස් පොඩ්ඩා නමැත්තාට වෙඩිතබා ඔහු ඇතුළු තිදෙනකු ඝාතනය කිරීමේ වෙඩික්කරු වන්නේ ඔහුය. එම වෙඩි තැබීමෙන් පසු සාජා බලා පලා ගිය ඔහු 2024 ජුනි 10 වැනිදා අත්අඩංගුවට ගන්නේ එරටින් පිටුවහල් කර මෙරටට පැමිණි අවස්ථාවේදීය.



### 02. හරක් කටා

නදුන් චින්තක වික්‍රමරත්න නොහොත් හරක් කටා අවස්ථා කිහිපයකදීම ඩුබායි පොලිසියට මෙන්ම මාලදිවයින් ආරක්ෂක අංශයටද හසුවී බේරුණු අයෙකි. මහා පරිමාණ මත්කුඩු ජාවාරම්කරුවෙක් මෙන්ම පාතාල අපරාධකරුවෙක් ද වේ. දකුණු පළාත කේන්ද්‍ර කරගනිමින් පාතාල අපරාධ මෙහෙයවූ ඔහු ඇතුළු පාතාල ගෝලබාලයන් 08 දෙනෙක් මැඩගස්කරයේදී එරට ආරක්ෂක අංශ වෙත හසුවන්නේ පුද්ගලික ජෙට් යානයකින් ඩුබායි සිට එහි ගොස් සිටියදීය.

2023 වසරේ මාර්තු 01 වැනිදා එරට ආරක්ෂක අංශ ඔහු ඇතුළු පිරිස අත්අඩංගුවට ගත්තේය. ජාත්‍යන්තර පොලිසිය මගින් රතු නිවේදන නිකුත් කළ අය ඒ අතර සිටියේ දෙදෙනෙකි. ඒ, හරක් කටා සහ සළිඳු පමණි. එරටින් අපට ලැබෙන්නේ ඔවුන් දෙදෙනා පමණි.

2023 මාර්තු 15 වැනිදා ඔවුන් දෙදෙනාව අවදානමක්ද ඇතිව රැගෙන එන්නේ විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් දෙදෙනකුගේ ආරක්ෂාව යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනකු විසිනි.



### 03. කුඩු සළිඳු

සළිඳු මල්ෂිත ගුණරත්න හෙවත් කුඩු සළිඳු පානදුර කේන්ද්‍ර කරගෙන මත්කුඩු ජාවාරම මෙහයවූවෙකි. මැඩගස්කරයේ සිට රැගෙන ආ ඔහු 2024 වසරේ දෙසැම්බර් 20 වැනිදා අධිකරණයෙන් ඇප ලැබී පැය 24ක්වත් මෙරට රැඳී සිටියේ නැත. නැවත රටින් පැන්නේය.



### 04. ගනේමුල්ල සංජීව

මාකඳුරේ මධුෂ්ගෙන් පසු පාතාලයේ ගෝඩ් ෆාදර් වෙන්නට පෙරුම්පුරමින් සිටි ප්‍රබල පාතාල අපරාධකරුවෙක් වූ සංජීව කුමාර සමරරත්න නොහොත් ගනේමුල්ල සංජීව ව්‍යාජ විදෙස් ගමන් බලපත්‍රයකින් රැඳී සිටියදී අත්අඩංගුවට ගන්නේ නේපාලයේ කත්මන්ඩු නුවරදී 2023 සැප්තැම්බර් 13දා එරට ආරක්ෂක අංශ විසිනි. කටුනායක ගුවන් තොටුපළේදී ඔහු අත්අඩංගුවට ගන්නේ පිටුවහල්කර මෙරටට එවීමෙන් අනතුරුවය. ප්‍රතිවිරුද්ධ පාතාල කල්ලි විසින් කළ සැලසුමකට අනුව 2025 පෙබරවාරි 19 වැනිදා අලුත්කඩේ මහෙස්ත්‍රාත් අධිකරණ ශාලාව තුළදීම ඔහුව වෙඩි තබා ඝාතනය කරන ලදී.

### 05. සමිට්පුර චතු

කංකානම්ගේ දිමුතු චතුරංග පෙරේරා නොහොත් සමිට්පුර චතු මනුෂ්‍ය ඝාතන කිහිපයකට සම්බන්ධ ප්‍රධාන සැකකරුවෙකි. ඩුබායිහි සැඟවී සිටියදී රතු නිවේදනයකට අනුව අත්අඩංගුවට ගෙන මෙරටට ඔහුව රැගෙන එන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සිවු දෙනෙක් විසිනි. ඒ, 2024 ජූලි 12 වැනිදාය.



### 06. ජම්බුගස්මුල්ලේ බබී

දිනේෂ් ශ්‍යාමන්ත ද සිල්වා නොහොත් ජම්බුගස්මුල්ලේ බබී කොහුවල ප්‍රදේශයේ 2019 සිදුවූ මනුෂ්‍ය ඝාතනයකට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමට සොයමින් සිටියදී ඩුබායි පැන්න පාතාල අපරාධකරුවෙකි. ඔහුවද රැගෙන එන්නේ ජූලි 12දාය. අධිකරණයෙන් ඇප ලැබීමෙන් පසු ඔහු නැවත රටින් පැන්නේය. එවර ඔහු නේපාලයට පැන සිටියදී සෙව්වන්දි සමග නැවත කොටුවිය.

### 07. මන්න රමේෂ්

රමේෂ් ප්‍රියජනක හෙවත් මන්න රමේෂ් අවිස්සාවේල්ල ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වූ ප්‍රධාන පෙළේ සංවිධානාත්මක අපරාධ කල්ලි නායකයකු මෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකි. රතු නිවේදනයකට අනුව ඩුබායිහිදී අත්අඩංගුවට ගත් ඔහුව මෙරටට රැගෙන එන්නේ 2024 මැයි 07 වැනිදාය.



### 08. මිදිගම රුවන්

රුවන් චාමර හෙවත් ජේ.ඒ. රුවන් කුමාර හෙවත් මිදිගම රුවන් යනු හරක් කටාගේ ප්‍රධාන ගෝලයන් දෙදෙනාගෙන් අයෙකි. හරක් කටාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පැන්නීමට සැලසුම් කළේද ඔහුය. ඩුබායිහි සමාජ ශාලාවක සිදුවූ ගැටුමකින් අනතුරුව අත්අඩංගුවට ගත් ඔහුව මෙරටට එවනු ලබන්නේ රතු නිවේදනයකට අනුව 2024 මැයි 31දාය.



### 09. පියුමා

හපුන්ත්‍රීගේ දොන් පියුම් හස්තික නොහොත් පියුමා යනු කුඩු සළිඳුගේ සමීපතම ගෝලයෙකි. 2021 වසරේ සිදුවූ ඝාතනයකින් පසු රටින් පනින ඔහු ඩුබායි හිදී අත්අඩංගුවට ගෙන මෙරටට රැගෙන එන්නේ 2024 පෙබරවාරි 15දාය.

### 10. බිනෝයි

ගීත්මාල් බිනෝයි දිල්ෂාන් නොහොත් බිනෝයි යනු ප්‍රබල පාතාල අපරාධකරුවෙක් වන මතුගම ශාන් නමැත්තාගේ ගෝලයෙකි. ඩුබායිහිදී අල්ලාගෙන මෙරටට ඔහුව රැගෙන එන්නේ 2024 වසරේ අගෝස්තු 29දාය.

### 11. රන්මුණි මහේෂ් හේමන්ත සිල්වා

2024 ජනවාරි 22 වැනිදා සිදුවූ බෙලිඅත්ත පස් පුද්ගල ඝාතන සිද්ධියේ පොලිසියට අවශ්‍ය කර සිටි ප්‍රධානතම සැකකරුවෙකි. වැඩ තහනමට ලක්ව සිටින පොලිස් නිලධාරියෙක් වන ඔහු 2025 පෙබරවාරි 07 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඩුබායි සිට රැගෙන අවේය.

මේ හැරුණු කොට අවස්ථා කිහිපයකදීම තවත් අපරාධකරුවන් ඩුබායි ඇතුළු රටවල් කිහිපයකින්ම මෙරටට පිටුවහල්කර ඇත. ඔවුන් ප්‍රබල අපරාධකරුවන්ගේ කීමට අපරාධවල නිරතවූ අය මිස ලොකු වැඩකරුවන් නම් නොවේ.

## 2024 සිට මාලිමා ආණ්ඩුව (අනුර යුගය)



### 01. පොඩි ලැසී

අරුමාහන්දි ජනිත් මධුසංඛ ද සිල්වා හෙවත් පොඩි ලැසී දකුණු පළාත කේන්ද්‍ර කරගත් මත්ද්‍රව්‍ය ජාවාරමේ ලොකු පුරුකකි. පාතාලයේ ප්‍රබලයෙකි. පාතාල අපරාධ සම්බන්ධයෙන් කාලයක්ම ඇප නොලබා බන්ධනාගාරගතව සිටි ඔහු 2024 දෙසැම්බර් 09 වැනිදා බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයෙන් දැඩි කොන්දේසි සහිත ඇප ලැබුණි. ඇප ලබා ඔහු දිනක් දෙකක් තුළ බෝට්ටුවක නැඟී ඉන්දියාවට පැන ගත්තේය.

බොලිවුඩ් නළු සයිෆ් අලි ඛාන්ගේ නිවසට පැන්න හොරු අල්ලන්න මුම්බායි පොලිසිය කළ මෙහෙයුමකදී 2025 වසරේ ජනවාරි මාස අත්අඩංගුවට පත්වූ ඔහු මෙරටට භාරදෙනු ලැබුවේ 2026 පෙබරවාරි 27 වැනිදාය.



### 02. පොලිස් සැරයන් රවින්ද්‍ර සන්දීප

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවයේ නිරතව සිටි ඔහු හරක් කටා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පැන්නීමට පොලිස් නිලධාරීන්ට උදව් කළ අයෙකි.

### 03. නාරාහේන්පිට අමිල

අමිල චන්ද්‍රානන්ද නොහොත් නාරාහේන්පිට අමිල නමැත්තා පාතාලයට අවි සැපයූ ජාවාරම්කරුවෙක් ලෙස පොලිසිය හඳුනාගත් අයෙකි. පොළොන්නරුවේ පිහිටි හමුදා කඳවුරකින් ගිනි අවි විශාල ප්‍රමාණයක් පැන්නීමේ කතාව සමග එළියට ආ චරිතයක් වන ඔහු රටින් පැන්නේ ඒ ගැන විමර්ශන ආරම්භ කිරීමත් සමගිනි. ඉන්දියාවේදී එරට පොලිසියට හසුවන අමිල පිටුවහල්කර මෙරටට එවන්නේ 2025 පෙබරවාරි 19 වැනිදාය.

### 04. ගුණසීලන් ප්‍රකාශ් සහ ගුණසේකර් දේව සුදාන්

යාපනයේ සිදුවූ වෙඩි තැබීම්වලට සහ සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධ මෙම පුද්ගලයන් දෙදෙනා ඉන්දියාවේදී අත්අඩංගුවට ගෙන 2026 වසරේදී පෙබරවාරි 06දා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මෙරටට රැගෙන එන ලදී.



### 05. කෙහෙල්බද්දර පද්මේ

පාතාලයේ නැගීඑන ප්‍රබල අපරාධකරුවෙක් වූ කෝරල ගමගේ මන්දිනු පද්මසිරි පෙරේරා හෙවත් කෙහෙල්බද්දර පද්මේ පොලිසියේ අවධානයට යොමුවන්නේ ගම්පහ අධිකරණය අසලදී පස් පොඩ්ඩා ඇතුළු තිදෙනෙක් වෙඩිතබා ඝාතනය කිරීමත් සමගිනි. අනතුරුව ඔහු පාතාලයේ ප්‍රබල චරිතයක් බවට පත්වන්නේ ගනේමුල්ල සංජීව අලුත්කඩේ අධිකරණයේදී ඝාතනය වීමත් සමගිනි. ඉන්දුනීසියාවේ ජාකර්තා නුවර සැඟවී සිටි මොහු ඇතුළු පාතාලයේ ප්‍රබලයන් 05 දෙනෙක් අල්ලාගෙන මෙරටට රැගෙන එන්නේ 2025 අගෝස්තු 30දාය.



### 06. කොමාන්ඩෝ සලින්ත

පාතාලයේ අපරාධකරුවෙක් වන සලින්ත මධුෂාන් පෙරේරා නොහොත් කොමාන්ඩෝ සලින්ත කෙහෙල්බද්දර පද්මේ සමග ඉන්දුනීසියාවේදී අත්අඩංගුවට ගෙන රැගෙන ආ අයෙකි.



### 07. බැකෝ සමන්

ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙක් වන නිර්මාල් ප්‍රසංග නොහොත් බැකෝ සමන් ද ඉන්දුනීසියාවේදී අල්ලාගෙන ආ අයෙකි.



### 08.පානදුරේ නිලංග

නිලංග අසංක නොහොත් පානදුරේ නිලංග නමැති මොහු පානදුර කේන්ද්‍ර කරගත් පාතාල අපරාධකරුවෙකි. ඉන්දුනීසියාවේ සිට අල්ලාගෙන ආ අපරාධකරුවෙකි.



### 09. තැඹිලි ළහිරු

ළහිරු මධුෂාන් නොහොත් තැඹිලි ළහිරුද ඉන්දුනීසියාවේ සිට අල්ලාගෙන ආ අපරාධකරුවෙකි.

### 10. රොටුඹ උපාලි

දකුණු පළාත කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වූ සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධ ප්‍රධාන පෙළේ පාතාල කල්ලි සාමාජිකයෙක් වන නඩකන්දගේ උපාලි නොහොත් රොටුඹ උපාලි රතු නිවේදනයකට අනුව 2025 පෙබරවාරි 02දා අත්අඩංගුවට ගන්නේ ඩුබායිහිදීය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔහුව මෙරටට රැගෙන එන්නේ 2025 පෙබරවාරි 07දාය.



### 11. ලොකු පැටී

ක්ලබ් වසන්ත ඝාතනය ඇතුළු ඝාතන රැසක් මෙහෙයවූ බව කියන ප්‍රබල දකුණේ ප්‍රබල අපරාධකරුවෙක් වූ ලත්තුවාහංදි සුජීව රුවන් කුමාර ද සිල්වා නොහොත් ලොකු පැටී රටින් පැන සැඟව සිටියේ බෙලරුස් රාජ්‍යයේය. එරටේදී 2024 අගෝස්තු 01 වැනිදා ඔහුව අත්අඩංගුවට ගන්නා අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එහි ගොස් රැගෙන එන්නේ 2025 මැයි 04දාය.

### 12. මිදිගම සහන්

මිනිස් ඝාතන මංකොල්ලකෑම් ඇතුළු අපරාධ රැසකට සම්බන්ධ හික්කඩුව ලියනගේ සිසිකැලුම් නොහොත් මිදිගම සහන් අත්අඩංගුවට ගනු ලබන්නේ ඉන්දියාවට පලාගොස් සැඟවී සිටියදීය. එරටින් පිටුවහල් කර චෙන්නායි නුවර සිට පැමිණෙන විටදී අත්අඩංගුවට ගන්නේ 2025 ජූලි 28දාය.



### 13. ඉෂාරා සෙව්වන්දි

ගනේමුල්ල සංජීව ඝාතනයෙන් පසු රටින් පැන්න ඇය නේපාලයේ රැඳී සිටින බව හඳුනාගත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කළ මෙහෙයුමක ප්‍රතිඵලයකත් ලෙස ඇය සමග 06 දෙනෙක් අල්ලාගෙන 2025 ඔක්තෝබර් 13 වැනිදා මෙරටට රැගෙන එන ලදී.

ඇය සමග සිටි සෙසු සැකකරුවන් වන්නේ ජීවදාසන් කනකරාසා, තක්ෂි නන්දකුමාර්, දිනේෂ් ශ්‍යාමන්ත ද සිල්වා, කෙනඩි බැස්ලියම්පිල්ලෙයි, දිනේෂ් නිශාන්ත කුමාර වික්‍රමආරච්චි යන අයයි.

රුවන් වෙඩිවර්ධන

# ඇමෙරිකාවෙන් එන්නෝ

**කෝටි ගණන් අල්ලස් ගැනීම්, අත්අඩංගුවට පත්වීම්, පාර්ලිමේන්තුව ඇතුළේ විරෝධතා, සෙංකෝලය ඔසවාගෙන යෑමට උත්සාහ කිරීම් ආදී එකී නොකී දේශපාලන නාටක අස්සේ වසා යටවී කවුරුත් නොදන්නා සුවිශේෂ දේශපාලන සිදුවීම් රැසක්ද තිරය පිටුපස සිදුවෙමින් පවතින ආකාරයක් මේ දිනවල දැකගැනීමට පුළුවන.**

නමුත් රටේ ජනතාවගේ අවධානය එළිපිට සිදුවන මෙවැනි සිදුවීම්වලට යොමුවී තිබෙනවා විනා තිරය පිටුපස සිදුවන අතිශය තීරණාත්මක සිදුවීම් පිළිබඳ හෝ ඒ පිළිබඳ විවරණයක යෙදෙන්නට ඔවුන්ගේ උනන්දුවක් ඇති බවක් දැකගන්නට නැත. නමුත් ජනතාව නොදන්නා, මාධ්‍ය මගින් එළියට නොඑන තිරය පිටුපස සිදුවන අතිශය සංවේදී සහ විශේෂ සිදුවීම් පිළිබඳ අලුත්ම අලුත් තොරතුරු සතිපතා ජනතාව හමුවට ගෙන එන 'රාජ්‍ය රහස්' තීරය මෙවරද සූදානම් වන්නේ කවුරුත් නොදන්නා තිරය පිටුපස සිදුවන එවැනි අලුත්ම සිදුවීම් පෙළක තොරතුරු රටට පළමු වතාවට හෙළිදරව් කරන්නටය.

පසුගිය වතාවකදී 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ අප විශේෂ අනාවරණයක් කරමින් ඇමෙරිකාව මෙරට අතිසංවේදී ආර්ථික මර්මස්ථානවල ආයෝජනය කිරීමට සැලසුම් කරමින් සිටින ආකාරය පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට කටයුතු කළෙමු. එහිදී දකුණු හා මධ්‍යම ආසියානු කලාප භාර ට්‍රම්ප්ගේ විශේෂ නියෝජිතයා මෙන්ම ඉන්දියාවේ ඇමෙරිකානු තානාපතිවරයාද වන සර්ජියෝ ගෝර් මීට මාස කිහිපයකට ඉහතදී ලංකාවට පැමිණ ජනාධිපතිවරයා හමුවූ ආකාරයත්, එම හමුවෙන් පසු කෙළින්ම කොළඹ වරායේ බටහිර පර්යන්තයට ගොස් එහි නිරීක්ෂණ චාරිකාවක නිරත වූ ආකාරයත් 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ වාර්තා කිරීමට අපි කටයුතු කළෙමු. මීට අමතරව දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර රාජ්‍ය ලේකම්වරයා වූ පෝල් කපූර් ඇමෙරිකානු සෙනට් සභාව ඉදිරියේ ලංකාවේ ඇති වැදගත්කම පිළිබඳ විශේෂ තොරතුරු රැසක් ඉදිරිපත් කළ ආකාරයත් පසුගිය පෙබරවාරියේදී අපි වාර්තා කර සිටියෙමු. කපූර් ලංකාව ගැන සෙනට් මණ්ඩලයට කී කතාව එදා 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ අප වාර්තා කර සිටියේ මෙසේය.

## අපි විතරයි හෙළිකළේ...

**'පසුගිය සතියේ ඇමෙරිකානු සෙනෙට් මණ්ඩලයේ විදේශ සබඳතා කමිටුවේ රැස්වීමක් පැවැති අතර, ඊට දකුණු සහ මධ්‍යම ආසියානු කලාපය භාර සහකාර ලේකම් පෝල් කපූර් මහතාද එක්ව සිටි ආකාරය දැකගත හැකි විය. එහිදී සාකච්ඡාව යොමු වී තිබුණේ දකුණු ආසියානු කලාපය තුළ ඇමෙරිකානු විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ ඊට අදාළ උපාය උපක්‍රම සෙවීම සම්බන්ධයෙනි.**

මෙම සාකච්ඡාවේදී කිසිවකුත් නොසිතූ ආකාරයට ලංකාව සම්බන්ධයෙන් අතිශය වැදගත් කතාවක් මේ පෝල් කපූර්ගෙන් එළියට පැමිණියේය. එහිදී ඇමෙරිකානු බලධාරීන් ඉන්දියන් සාගර කලාපය ඇතුළත දියත් කළ යුතු ඉදිරි සැලසුම් මොනවාද යන්න පිළිබඳ විමසද්දී පෝල් කපූර් ලංකාව සම්බන්ධයෙන් අතිශය වැදගත් කරුණු කිහිපයක් අනාවරණය කිරීමට පියවර ගත්තේය.

'මේ වෙද්දී ලංකාව ඉන්දියන් සාගරයේ සහ දකුණු ආසියානු කලාපයේ තියෙන වැදගත්ම මුහුදු මාර්ගය බවට පත්වෙලා අවසානයි. මැදපෙරදිග තෙල් නැව් විතරක් නෙවෙයි ආනයන අපනයන සිදුකරන ප්‍රධාන මුහුදු මාර්ගයත් වැටිලා තියෙන්නේ ලංකාව ආසන්නයෙන්. පසුගිය කාලෙදි වොෂින්ටන් මැප් එකේ ලංකාවයි, ලංකාවේ මුහුදු තීරයයි ලොකු අවධානයක් යොමුවෙලා නොතිබුණත්, මේ වෙද්දී මතුවෙලා තියෙන තත්ත්වය අනුව ලංකාව තවත් දකුණු ආසියාවේ සාමාන්‍ය රටක් විදියට පිළිගන්න බෑ. මේක කල්පිය තේරුම් අරගෙන වෙන්න ඇති චීනය බරපතළ විදියට ලංකාව ඇතුළේ බලය අත්පත් කරගන්න හදන්නේ. ඔවුන් දැනටමත් හම්බන්තොට වරාය අත්පත් කරගෙන අවසන්. ඒක ඔවුන්ට විශාල හයියක්. ඒ වගේම 2022 චීන පර්යේෂණ නෞකාවක් ලංකා ගමනක් අතිශය භයානකයි. ඒක අපිට දීපු ලොකු සංඥාවක්. ඒ නිසා මීත් ඉදිරියට ඇමෙරිකාවටයි ඉන්දියාවටයි මේ ගැන ඉතා සමීපව ඇහැ ගහගෙන ඉන්න වෙනවා..' යැයි කී කපූර් තවත් පුදුමසහගත ප්‍රකාශයක් කිරීමට මෙහිදී පියවර ගත්තේය. ඒ, චීනය මුල්කරගෙන මතුවී ඇති ඉන්දු-පැසිෆික් කලාපයේ ගැටුම දෙස ඇමෙරිකාව ඉතා සමීපව නිරීක්ෂණය කළ යුතු බවයි.

## මොකද කරන්න ඕනෑ


**ඒ අනුව සෙනට් කමිටුව කපූර්ගෙන් නැවතත් ප්‍රශ්න කර සිටියේ එසේ නම් ලංකාව ගැනවත් ඇමෙරිකාව දෙසට හරවා ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ගයන් මොනවාදැයි කියාය. ඊට කපූර් දුන්නේ මෙවැනි පිළිතුරකි.**

'ලංකාව මේ වෙද්දී විශාල ආර්ථික අර්බුදයකින් ගොඩ එමින් ඉන්නේ. නමුත් ඒ අයට මේ අර්බුදයට මුහුණ දෙන්න නිසි ආර්ථික සැලැස්මක් නැහැ. ඒ නිසා අපි ඒ අයට ආර්ථික සැලැස්මක් හදන්න ඕනේ. ඒකට මූල්‍ය අරමුදලේ සහාය ලංකාවට අපි දෙන්න ඕනේ. ඒ වගේම ලංකාව විදෙස් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රශ්නය නිරාකරණය කළ ඕනේ. ආයෝජන ගලා එමේ ප්‍රශ්නයකුත් ලංකාව හිර වෙලා ඉන්නවා. ඒ නිසා අපි පුළුවන් තරම් ඉන්දියාවත් එක්ක සම්බන්ධය හදාගන්න ලංකාවට උදව් කරන්න ඕනේ. මේ වෙද්දී ලංකාව චීන ණයකයට අනුවෙලා ඉන්නේ. චීනයෙන් විශාල වශයෙන් ලංකාව ණය අරගෙන ඉන්නවා. ඒකෙන් නිදහස් වෙන්න ඔවුන්ට බැහැ. යටිතල පහසුකම්වලට විශාල වශයෙන් චීන ණය අරන් තියෙනවා. ඒ ගෙවන්න තියෙන ණය දැන් ටිකක් අඩු කරලයි තියෙන්නේ.'

'ඒ වගේම ලංකාව එක්ක ඇමෙරිකාව යුද්ධමය සහයෝගීතාව සීඝ්‍රයෙන් වැඩි කරන්න ඕනේ. මම නම් කියන්නේ ඒකට ලංකාව ඇතුළේ ඇමෙරිකානු හමුදා කඳවුරක් හදනවට වඩා ඉන්දියාවත් එක්ක කරගෙන නාවික ආරක්ෂාව සම්බන්ධයෙන් මෙහෙයුම් කරන්න ඕනේ කියලයි. ලංකාවට ඒකට අවශ්‍ය යුද උපකරණ ලබාදෙන්න ඕනේ..' යනුවෙන් කපූර් එහිදී යෝජනා කර සිටියේය. ඒ හරහා කපූර් පෙන්වා දුන්නේ ඇමෙරිකානු කඳවුරක් ලංකාවේ ස්ථාපිත කරනවාට වඩා හමුදාමය පුහුණු මෙහෙයුම්, බුද්ධි සේවා, යුද උපකරණ සම්බන්ධයෙන් තවදුරටත් ලංකාව සමග ගිවිසුම්වලට එළඹිය යුතු බවයි. එමෙන්ම ඉන්දීය සාගරයේ සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම නිරීක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවද කපූර් මෙහිදී ඇමෙරිකානු සෙනට් කමිටුවට පෙන්වා දුන්නේය.

ඒ අනුව බැලීමේදී කපූර්ගේ මේ ප්‍රකාශය හරහා එක්තරා ආකාරයකට ලංකාවට පැහැදිලි වාසිසහගත තත්ත්වයක් ගොඩනැගී තිබේ. විශේෂයෙන්ම ලංකාවට ආයෝජන ලබාගැනීම සහ ආර්ථික අර්බුදයෙන් ගොඩ එම සඳහා දැවැන්ත සහයක් කපූර්ගේ මෙම ප්‍රකාශය හරහා උදාකර ගැනීමේ අවස්ථාවක් උදාවී ඇති ආකාරයක් දැකගත හැකිය.

*- 2022 පෙබරවාරි 22 (රාජ්‍ය රහස්)*




# කපූර් - ජෙනරාල් කෙවින් ලංකාවට ඇවිත් කරපු රහස් සාකච්ඡා මොනවද?

## ෂ්නයිඩර්ගේ ලංකා ගමන

**ඒ අනුව අප පසුගිය සතියේ විශේෂ අනාවරණයක් කරමින් කියා සිටියේ මේ පෝල් කපූර් ලංකාවට පැමිණීමට නියමිත බවත්, හෙතෙම ජනාධිපතිවරයා හමුවීමට නියමිත බවත්, ඉන් අනතුරුව කොළඹ වරායේ සංචාරය කිරීමට නියමිත බවත්ය. මේ පෝල් කපූර් යනු භාවිත හමුදා පසුබිමක් සහිත පුද්ගලයෙකි. ඒ අනුව ඔහු අත්දැකීම් නිසාම භාවිත කටයුතුවලට වැදගත්කම සහ භාවිත කටයුතු සම්බන්ධයෙන් පෝල් කපූර්ට ඇත්තේ දැනුම් සම්භාරයකි.**

කෙසේ වෙතත් පෝල් කපූර් ලංකාවට පැමිණීමට දින දෙක තුනකට පෙරාතුව තවත් විශේෂ ඇමෙරිකානු නියෝජිතයකු ලංකාවට පැමිණියේය. ඒ, ආසියානු පැසිෆික් කලාපය භාර අණ දෙන මධ්‍යස්ථානයේ ගුවන් හමුදා ප්‍රධානී ජනරාල් කෙවින් ෂ්නයිඩර් මහතාය. වැඩි සද්ද බද්දයකින් තොරව ලංකාවට පැමිණි ජනරාල් කෙවින් ෂ්නයිඩර් ඊට පෙරාතුව ඉන්දියාවේද දින කිහිපයක සංචාරයක නිරතව සිටියේය. ඒ අනුව ඉන්දියාවේ සිටින ඇමෙරිකානු විශේෂ නියෝජිතයා වන සර්ජියෝ ගෝර් හමුවී ජනරාල් කෙවින් ෂ්නයිඩර් සාකච්ඡා කළ බවට කිසිදු සැකයක් නැත. මේ සියලු සිදුවීම් එකින් එක සිදුවූයේ පසුගියදා තාවකාලිකව අවසන් වූ ඇමෙරිකා ඉරාන යුද්ධය ආරම්භ වීමෙන් අනතුරුවය.

## ප්‍රංශයත් කොළඹට එනවා

**සිය ලංකා සංචාරයේදී සර්ජියෝ ගෝර් වරායට ගොස් නිරීක්ෂණය කළේ බටහිර පර්යන්තයේ නන්න්වයය. ඒ අනුව එහි ඇමෙරිකානු ආයෝජනයක් ලෙස නව පර්යන්තයක් ඉදිකිරීම ඇමෙරිකාවේ සැලසුම වී තිබිණි. නමුත් මේ වනවිට එය වෙනත් පැත්තකට පෙරළෙන ආකාරයක් දැකගන්නට ඇත්තේ හදිසියේම ප්‍රංශ සමාගමක්ද කොළඹ වරායේ ආයෝජනය කිරීම සඳහා සිය අභිලාශය ඉදිරිපත් කිරීමත් සමගය.**

ඒ අනුව පසුගිය සතියේ විශේෂ නිවේදනයක් නිකුත් කරමින් ප්‍රංශයේ දැවැන්ත සමාගමක් වන සී.එම්.ඒ.-සී.ජී.එම්. සමාගම කියා සිටියේ තමන් කොළඹ වරායේ ආයෝජන කටයුතු කිරීම සඳහා සූදානමින් සිටින බවකි. මේ තොරතුරු එළියට පැමිණියේ වරාය අමාත්‍ය අනුර කරුණාතිලක මහතා හා ප්‍රංශ තානාපතිවරයා අතර පැවැති සාකච්ඡාවක් අතරතුරේදීය.

එම සාකච්ඡාවේදී ලෝකයේ ප්‍රමුඛ නාවික ප්‍රවාහන සමාගමක් වන සී.එම්.ඒ. සී.ජී.එම්. ආයතනයේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී රොඩොල්ෆ් සාදේ මහතා සමග ජනාධිපතිවරයා හමුවක් පැවැත්වීමට නියමිත බව ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති රෙමි ලැම්බර්ට් මහතා ප්‍රකාශ කළේය. ඒ අනුව ලබන 13 වැනිදා ජනාධිපතිවරයා ප්‍රංශයේ නිල සංචාරයක නිරත වීමට නියමිතව තිබේ. එමෙන්ම ප්‍රංශ ආයෝජනයන් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීමට දැඩි උනන්දුවක් පවතින බවද තානාපතිවරයා සඳහන් කළේය.

ආයෝජක කණ්ඩායමේ ප්‍රධානත්වය දැරූ සී.එම්.ඒ. සී.ජී.එම්. ආයතනයේ ප්‍රධාන නියෝජ්‍ය සභාපතිනී ක්‍රිස්ටීන් කැබෝ මහත්මිය සඳහන් කළේ, තම සමාගම ලෝකයේ ප්‍රධාන වරායන්හි බහාලුම් පර්යන්ත 65කට වැඩි සංඛ්‍යාවක හිමිකාරීත්වය දරන ප්‍රමුඛ පෙළේ පර්යන්ත මෙහෙයුම් සමාගමක් බවයි. කොළඹ වරායේ උපායමාර්ගික පිහිටීම හේතුවෙන් බහාලුම් ප්‍රතිඅපනයන කටයුතු පුළුල් කිරීමට විශාල හැකියාවක් පවතින බවත්, හවුල් ව්‍යාපාර ආයෝජන හරහා බහාලුම් ප්‍රවාහන පරිමාව වැඩි කිරීමට අවධානය යොමුකරන බවත් ඇය පැවසුවාය. කොළඹ වරායේ බටහිර පර්යන්තයේ දෙවැනි අදියර ව්‍යාපෘතිය පිළිබඳවද තම සමාගම අධ්‍යයනය කරමින් සිටින බව ඇය එහිදී අදහස් දක්වමින් කියා සිටියාය.

මීට අමතරව පසුගිය සතියේ ලෝක බැංකුවද කොළඹ වරාය සම්බන්ධයෙන් අතිශය වැදගත් නිවේදනයක් නිකුත් කිරීමට පියවර ගෙන තිබිණි. කොළඹ වරායේ ඇති වැදගත්කමත්, එහි සිදුකළ යුතු ආයෝජනයන් සම්බන්ධයෙනුත් මෙහිදී ලෝක බැංකුව විශේෂ ප්‍රකාශයක් සිය නිවේදනය මගින් ප්‍රකාශ කොට තිබිණි. ඒ අනුව සර්ජියෝ ගෝර්ගේ ලංකා සංචාරයත්, පෝල් කපූර්ගේ ලංකා සංචාරයත්, ප්‍රංශයේ ප්‍රධාන නාවික සමාගමක් මගින් කොළඹ වරාය පිළිබඳ නිවේදනයක් නිකුත් කිරීමත්, ලෝක බැංකුව මගින් කොළඹ වරාය පිළිබඳ නිවේදනයක් නිකුත් කිරීමත් එක දම්වැලක ඇමිණුනු පුරුක් ලෙස හඳුනාගත යුතු බව බොහෝ දෙනාගේ අදහස වී තිබිණි.

## වරාය නියෝජිතයන් සජිත් හමුවෙයි

**මෙවැනි වාතාවරණයක් පැවැතියදී පසුගිය සතියේ වරායේ වෘත්තීය සමිති නියෝජිතයන් කිහිප දෙනකු හදිසියේම විපක්ෂ නායක කාර්යාලයට පැමිණ කොළඹ වරාය සම්බන්ධයෙන් අතිවිශේෂ හෙළිදරව්වක් විපක්ෂ නායකවරයා වෙත සිදුකිරීමට පියවර ගෙන තිබිණි. මෙහිදී පළමුවෙන්ම සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වරායේ නියෝජිතයන් කියා සිටියේ වරායේ දැනට පවතින විශාලම සම්පත වන නැගෙනහිර පර්යන්තයේ වැඩ අවසන් කොට ලබන වසරේදී එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇති නමුත්, මේ වනවිට ආණ්ඩුව නැගෙනහිර පර්යන්තය විදෙස් සමාගමකට විකුණා දැමීමට පිඹුරුපත් සකස් කරමින් සිටින බවකි.**

සාමාන්‍යයෙන් වරාය සැලකෙන්නේ ආණ්ඩු පෙරළියකදී පළමුවෙන් එළියට බහින වෘත්තීය සමිති ලෙසය. පසුගිය ආණ්ඩු කිහිපයක්ම විවිධ හේතු මත බිඳවැටුණද ඒවාට අවශ්‍ය මුල බීජයන් පළමුව සපයා දී තිබුණේ වරාය වෘත්තීය සමිති මගිනි. ඒ අනුව සජිත් හමුවූ වරායේ මේ වෘත්තීය සමිති නායකයන්ද සජිත්ට දැනුම් දී තිබුණේ ආණ්ඩුව යම් හෙයකින් රන් බිජු දමන වරායේ කිකිළිය වූ නැගෙනහිර පර්යන්තය විකුණා දැමීමට උත්සාහ කරන්නේ නම් ඊට එරෙහිව ජීවිත පරිත්‍යාග යෙන් හෝ කටයුතු කිරීමට තමන් සූදානම් බවකි. ඒ අනුව විපක්ෂ නායකවරයාද වරාය නියෝජිතයන්ගේ මෙම හෙළිදරව්වෙන් පසුව පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් කරමින් ආණ්ඩුව වරායේ නැගෙනහිර පර්යන්තය විකුණා දැමීමේ සූදානමකින් පසුවන බව රටට දැනුම් දීමට පියවර ගත්තේය.

මේ සියලු කරුණු දෙස සියුම්ව බැලීමේදී පෙනී යන විශේෂ කරුණක් වන්නේ ඉරානය සමග පැවැත්වූ මාස 2ක් වැනි කෙටිකාලීන යුද්ධයකින් පසු ඇමෙරිකාවට කොළඹ වරාය සහ ලංකාවේ අනෙකුත් වරායන් සහ ආර්ථික මර්මස්ථාන අතිශයින් වැදගත් වී ඇති බවකි. විශේෂයෙන්ම යුද්ධයෙන් පසු චීනය දැවැන්ත ආර්ථික වර්ධනයක් හිමිකර ගැනීමේ ලකුණු පහළ කිරීමත් සමග ඇමෙරිකාව මේ වනවිට සැලසුම් කරමින් සිටින්නේ දැවැන්ත ආයෝජන රැගෙන එමින් ලංකාවේ මර්මස්ථානවලට පිවිසීමටය. ඒ අනුව දැනටමත් ලොව ප්‍රධාන ඇමෙරිකානු සමාගමක් වන මර්ක් ආයතනය කොළඹ වරායේ බටහිර පර්යන්තයේ නව දියකඩනයක් සමග වරායක් ඉදිකිරීමට සිය අභිලාශය පළකොට ඇති ආකාරයක් දැනගන්නට ඇත. එසේ කිසියදී ඇමෙරිකානු රජයටම කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයට ඇතුළු වීමට අසීරු නිසා ප්‍රංශය වැනි රටක් ඊට ඉදිරිපත් කිරීම හරහා එහි බලය තහවුරු කරගැනීමට ඇමෙරිකාව උත්සාහ දරන බවට සැකයක්ද බොහෝ දෙනා තුළ මතුව තිබේ.

## තෙල් ටැංකිවලටත් යෝජනාවක්

**මීට අමතරව සර්ජියෝ ගෝර් ලංකාවට පැමිණි අවස්ථාවේ තවත් යෝජනාවක් ඉදිරිපත් කරමින් ත්‍රිකුණාමලයේ පිහිටි තෙල් ටැංකි සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් යෝජනාවක් ලංකාවට ඉදිරිපත් කළ බවද අප මීට පෙර රාජ්‍ය රහස් තීරයේ වාර්තා කළෙමු. දැනටමත් එම තෙල් ටැංකිවලින් කොටසක් ඉන්දියාවට ලබාදී තිබීම හේතුවෙන් දැනට එහි ඉතිරිව ඇත්තේ අබලන් වූ තෙල් ටැංකි සැට ගණනකට ආසන්න ප්‍රමාණයක් පමණි. නමුත් ගෝර් ඉදිරිපත් කළ එම යෝජනාව ඒ අවස්ථාවේදී වැඩිදුර ඉදිරියට ගියේ නැත.**

කෙසේ වුවත් පසුගිය දිනෙක ලංකාවට පැමිණි ආසියා පැසිෆික් අණ දෙන මධ්‍යස්ථානයේ ගුවන් හමුදා ප්‍රධානී ජෙනරාල් කෙවින් ෂ්නයිඩර් නැවත වතාවක් මෙම යෝජනාව ලංකාවට ඉදිරිපත් කර ඇති බවක්ද ආරංචිය. විශේෂයෙන්ම එහිදී ඔවුන් පෙන්වා දී ඇත්තේ මෙම තෙල් ටැංකි භාවිත කිරීම මගින් ඇමෙරිකානු නෞකා බලඇණියට විශාල වාසියක් අත්පත් කරගත හැකි බවකි. නමුත් මෙම කලාපයේ ගමන් කරන ඇමෙරිකානු නෞකා ප්‍රමාණය ගත් විට මෙම තෙල් ටැංකි 60 කිසිසේත්ම ප්‍රමාණවත් නොවීම නිසා සම්පූර්ණ තෙල් ටැංකි ප්‍රමාණයම ඇමෙරිකාවට ලබාගැනීම සම්බන්ධයෙන් වූ යෝජනාවක්ද එහිදී ඉදිරිපත්ව ඇති බවක් දැනගන්නට ඇත. ඒ සඳහා විශාල ආයෝජනයක් සිදුකිරීමටද ඇමෙරිකාව පැත්තෙන් යෝජනා වී ඇති බවක් වාර්තා වේ. නමුත් ඊට ලංකාව පැත්තෙන් තවමත් නිශ්චිත ප්‍රතිචාරයක් ලැබී නොමැති අතර, එවැනි යෝජනාවක් නිල වශයෙන් සාකච්ඡාවට ගතහොත් ඉන්දියාව සහ චීනය ඊට කුමන ප්‍රතිචාරයක් දක්වනු ඇද්ද යන්න සම්බන්ධයෙන්ද ඇත්තේ බරපතළ ප්‍රශ්නාර්ථයකි.

## මත්තලටත් ලොකු ආයෝජනයක්

**මේ ආකාරයට කොළඹ වරායේ බටහිර පර්යන්තය, නැගෙනහිර පර්යන්තය සහ ත්‍රිකුණාමල තෙල් ටැංකි පිළිබඳ අවධානය යොමුකොට ඇති ඇමෙරිකාව මේ වනවිට මත්තල ගුවන් තොටුපළ ඉලක්ක කොට ගෙනද විශේෂ ආයෝජන ව්‍යාපෘතියක් යෝජනා කොට ඇති බවක් දැනගන්නට තිබේ. ඒ, මත්තල ගුවන් තොටුපළේ බෝයිං යානා නියමුවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමටය. ඒ අනුව ඇමෙරිකාව මේ වනවිට සූදානම් වන්නේ ලංකාවේ ප්‍රධාන මර්මස්ථානවලට අතිදැවැන්ත ආයෝජන රැගෙන එමින් එම ස්ථානවල ස්ථානගත වන්නටද යන්න පිළිබඳව විශාල සැකයක් බොහෝ දෙනා තුළ මතුව තිබේ.**

එය තහවුරු වන්නේ ලිපිය ආරම්භයේදී අප මීට පෙර අනාවරණ කළ පරිදි පෝල් කපූර් ඇමෙරිකානු සෙනට් මණ්ඩලය හමුවේ කළ ප්‍රකාශයටය. මෙම යෝජනා පසුගිය කාලයේද ඉදිරිපත් වුවත් මේ වනවිට ඇමෙරිකා - ඉරාන යුද්ධය හේතුකොට ගෙන එම යෝජනා ඉතා සක්‍රිය ලෙස නැවත වතාවක් කරළියට පැමිණ ඇති ආකාරයක් දැකගන්නට පුළුවන.

## ජනපති ජවිපෙ නීතිඥයන් හමුවේ

**මේ ආකාරයට ඇමෙරිකාව ලංකාවට මහා පරිමාණයෙන් ඇතුළු වීමට උත්සාහ දරද්දී පසුගිය සතියේ ආණ්ඩුව සිටියේ දේශපාලන වශයෙන් විපක්ෂය විසින් එල්ල කරනු ලැබූ චෝදනා රැසක සිරවය. ඉන් ප්‍රධානම එකක් වූයේ ජනාධිපතිවරයා විසින් මාස 6ක් තිස්සේ පුරප්පාඩුව පවතින උපරිමාධිකරණ විනිසුරු ධුර 6ක් පිරවීමට කටයුතු නොකිරීමය. මීට අමතරව අභියාචනා සහ උපරිමාධිකරණ විනිසුරුවන්ගේ විශ්‍රාම වයස් සීමාව දීර්ඝ කිරීමට ජනාධිපතිවරයා ගෙන ඇති තීන්දුව පිළිබඳවද විපක්ෂය පසුගිය සතියේ ආණ්ඩුවට එල්ල කර තිබුණේ විශාල විරෝධයකි. මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විවාදයක් ඉල්ලා පසුගිය සතියේ සජබය ප්‍රමුඛ විපක්ෂයේ සියලු පක්ෂ ලිපියකට අත්සන් තැබීමටද කටයුතු කොට තිබිණ.**

විපක්ෂය විසින් මතුකළ මෙම විරෝධය කෙතරම් ප්‍රබල වුවද කියනවා නම් එහි උණුසුම ආණ්ඩුව ඇතුළටත් නොදැනුණා නොවේ. ඒ අනුව පසුගිය සතියේ ජවිපෙ පමණක් නියෝජනය කරන නීතිඥවරුන් කණ්ඩායමක් හමුවී මෙම යෝජනා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ජනාධිපතිවරයා පියවර ගෙන තිබූ බවක් ආරංචිය. ඒ, ජවිපෙ නීතිඥවරුන් විසින් කාලයක් තිස්සේ ජනාධිපතිවරයා සමග සාකච්ඡාවක් අවශ්‍ය බවට පැලවත්ත පක්ෂ මූලස්ථානයට කර තිබූ දැනුම්දීම්වලට අනුවය. මෙම නීතිඥවරුන් ජනාධිපතිවරයා සමග සාකච්ඡාවක් ඉල්ලා තිබුණේද අධිකරණ විනිසුරුවන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීමට ජනාධිපතිවරයා ගෙන ඇතැයි කියන තීන්දුවට විරෝධය පළකිරීම සඳහාය. ජවිපෙ හාම්බිය නීතිඥවරුන් විශාල පිරිසක් එම තීන්දුවට පක්ෂය ඇතුළේ විරෝධය පළකොට තිබුණද, ඔවුන් කිසිදු අවස්ථාවක එය එළියට පැමිණ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට කටයුතු කොට නොතිබිණි.

## මොකද්ද හේතුව?

**ඒ අනුව පැවැති මෙම සාකච්ඡාවේදී ජවිපෙ නීතිඥවරු කෙළින්ම ජනාධිපතිවරයාට විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස දීර්ඝ කිරීමට ගෙන ඇති තීන්දුවට විරෝධය පළකරමින් අදහස් දැක්වීමට කටයුතු කළහ. නමුත් එහිදී ජනාධිපතිවරයා එම තීන්දුව ගත්තේ නම් ඊට බලපාන හේතු රැසක් නීතිඥවරුන් හමුවේ තැබීමට කටයුතු කළේය. එහිදී ජනාධිපතිවරයා කියා සිටියේ මෙය කිසිසේත්ම ආණ්ඩුවට ප්‍රචාරක වාසි හෝ ඡන්ද වාසි හෝ වෙනත් වාසියක් ලබාගැනීමේ අරමුණකින් සිදුකරන එකක් නොවන බවයි. කෙසේ වෙතත් එහිදී ජනාධිපතිවරයා පෙරලා ජවිපෙ නීතිඥවරුන්ගෙන්ද එක ප්‍රශ්නයක් ඇසීමට පියවර ගත්තේය.**

ඒ, එවැනි යෝජනාවකට විරෝධය පළකිරීමට ජවිපෙ නීතිඥවරුන්ට ඇති හේතුව කුමක්දැයි කියාය. එහිදී බොහෝ දෙනා ජනාධිපතිවරයාට පෙන්වා දී තිබුණේ නඩු විභාගවල දින ලබාදීම සම්බන්ධයෙන් මෙතෙක් පැවැති සම්ප්‍රදාය අහෝසි වීම මේ හරහා සිදුවනවා යැයි කියාය. නමුත් එහිදී ජනාධිපතිවරයා සිනාසෙමින් කියා සිටියේ 'ඉතින් හොඳයිනේ. නඩු මාස හය, හත, අවුරුද්ද කල් දදා ඉන්නවට වඩා ටක් ටක් ගාලා අහලා ඉවර කරන එක කොච්චර හොඳයිද? රටේ මිනිස්සුත් ඒකටනේ කැමැති? ඉතින් ඒක ඔබතුමාලා කියන්නේ හොඳ නෑ කියලද?' යැයි කියාය.

## බලපෑමට හර්ෂ බයවුණාද?

**පසුගිය සතියේ 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ සජබ මන්ත්‍රී අජිත් පී. පෙරේරා මහතා භාණ්ඩාගාරයෙන් ඩොලර් මිලියන 2.5ක මුදලක් අතුරුදන් වීම සම්බන්ධයෙන් පෞද්ගලික රූපවාහිනී නාලිකාවකට පැමිණ කළ ප්‍රකාශයක් වාර්තා කිරීමට කටයුතු කළෙමු.**

එහිදී අප කියා සිටියේ මෙම සිද්ධිය සම්බන්ධව මුදල් අමාත්‍යාංශය ලබාදුන් වාර්තාව ප්‍රසිද්ධියට පත්කිරීමට මුදල් කාරකසභාවේ සභාපති හර්ෂ ද සිල්වා මහතා කටයුතු කිරීමට උත්සාහ කළහොත් ඒ මහතා සභාපති ධුරයෙන් ඉවත් කරන බවට ආණ්ඩුවේ මැති ඇමැතිවරුන් තර්ජනය කළ බවක් අජිත් පෙරේරා මන්ත්‍රීවරයා අනාවරණ කළ බවකි. නමුත් ඒ අවස්ථාවේදී අජිත් පෙරේරා එසේ හර්ෂට තර්ජනය කළ ආණ්ඩුවේ මැති ඇමැතිවරුන්ගේ නම් සඳහන් කිරීමට කටයුතු කළේ නැත.

නමුත් මෙහි ගැටලුව ඇත්තේ එය නොව, එවැනි බරපතළ ආකාරයේ තර්ජනයක් කළේ නම් විපක්ෂයක් ලෙස ඒ සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් නොකළේ මන්ද යන්න පිළිබඳවය. පසුගිය සතියේ පාර්ලිමේන්තුව ආරම්භ වීමෙන් පසු විපක්ෂ ලොබියේ රැස්ව සිටි සජබ මන්ත්‍රීවරුන් පවා මේ සම්බන්ධයෙන් විවිධ අදහස් පළකරමින් කියා සිටියේ පක්ෂය මේ ගැන ප්‍රශ්න නොකර සිටීම සම්බන්ධයෙන් විශාල ගැටලුවක් මතුවනවා යැයි කියාය. අනෙක් අතට හර්ෂ ද මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රකාශයක් නොකිරීම සම්බන්ධයෙන්ද ඔවුන්ට ඇත්තේ බරපතළ ප්‍රශ්නයකි. හර්ෂ ඒ පිළිබඳ ප්‍රකාශයක් නොකළා පමණක් නොව, අජිත් පෙරේරා කළ ප්‍රකාශය ප්‍රතික්ෂේප කිරීමට හෝ කටයුතු නොකිරීම විශේෂ සිදුවීමකි. හර්ෂම කියන ආකාරයට මුදල් බලය තිබිය යුත්තේ පාර්ලිමේන්තුවට නම්, එම මුදල් බලය ක්‍රියාත්මක කිරීමේදී කිසියම් ගැටලුවක් පැනනගින්නේ



කපිල පුංචිමාන්නගේ

රාජ්‍ය රහස්

# වරාය නියෝජිතයන් සජිත් හමුවේ කරපු හෙළිදරව්ව

නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම මුදල් කමිටුවේ සභාපතිවරයා වශයෙන් හර්ෂගේත්, පාර්ලිමේන්තුවේත් වගකීමකි. නමුත් මේ දක්වා කිසිවකුත් ඒ පිළිබඳ වචනයක් හෝ කතා නොකිරීම පිළිබඳ සජබ මන්ත්‍රීවරුන් තුළ පවා මේ වනවිට ඇත්තේ බරපතළ සැකයකි.

පාර්ලිමේන්තුවේ අනෙක් කමිටුවල මෙන් නොව මුදල් කමිටුවේ සභාපති ධුරය නිල බලයෙන්ම හිමිවන්නේ විපක්ෂයටය. ඒ අනුව වසර කිහිපයක් පුරා අඛණ්ඩව එහි සභාපතිවරයා ලෙස කටයුතු කරන්නේ හර්ෂ ද සිල්වාය. වරක් රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු හර්ෂ ද සිල්වා මහතා එම තනතුරෙන් ඉවත් කිරීමට කටයුතු කොට තිබිණි. නමුත් එහිදී හර්ෂ වෙනුවෙන් පාර්ලිමේන්තුව ඇතුළේ දැවැන්ත සටනක් ගෙන ගියේ වෙන කවුරුවත් නොව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාය. රනිල් නැවත වතාවක් හර්ෂට මුදල් කමිටුවේ සභාපති ධුරය ලබාදෙන තෙක්ම සජිත් සිය සටන අත්හැරීමට කටයුතු කළේ නැත. ඒ අතරතුර කාලයේදී රනිල් මුදල් කමිටුවේ සභාපති ධුරය බලහත්කාරයෙන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලබාදී මුදල් පනත් කිහිපයක්ම සම්මත කරගැනීමට පවා පියවර ගෙන තිබුණේ තුට්ටු දෙකේ දේශපාලන සම්ප්‍රදාය පාර්ලිමේන්තුවටද රැගෙන එමිනි.

කෙසේ වෙතත් සජිත් එහිදී හර්ෂ වෙනුවෙන් සෘජුවම පෙනී සිටියද පසුගිය කාලයේ හර්ෂ කටයුතු කර තිබුණේ ඒ ආකාරයෙන් නම් නොවේ. පිටුපස සිට පිහියෙන් අනින්නාක් මෙන් තානාපති කාර්යාලවලට ගොස් හර්ෂ ගෙන ගොස් තිබුණේ පක්ෂ නායකත්වයට හානිකර ක්‍රියාකලාපයකි.

## මුදල් කමිටුව වහයි

**කෙසේ වෙතත් අජිත් පෙරේරා මෙම ප්‍රකාශය කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව රැස්වූ පළමු දිනයේම මුදල් කමිටුවට තවත් බරපතළ ප්‍රහාරයක් ආණ්ඩුව පාර්ශ්වයෙන් එල්ල විය. ඒ, මෙතෙක් මුදල් කමිටුවට ලබාදී තිබූ පාර්ලිමේන්තුවේ කමිටු කාමර අංක 5 කෝප් කමිටුවට ලබාදීමට ආණ්ඩුව පියවර ගැනීම හරහාය. ඒ සම්බන්ධයෙන් නම් හර්ෂ පාර්ලිමේන්තුවේදී දක්වා සිටියේ මෙවැනි අදහසකි.**

'මීට පස්සේ කමිටු කාමර පහ අඟහරුවාදා ඉඳලා සිකුරාදා වෙනකම් අටේ සිට පහ දක්වා කෝප් කමිටුවට දෙන්න නියෝගයක් කරලා. එහෙම ලියලා දීලා නැහැනේ. අපි ඒක බෙදාගෙන කළේ. ඊයේ පාර්ලිමේන්තුවේ කියවුණා මුදල් කාරක සභාවේ අවශ්‍යතාවක් නෑ කියලා. අපේ කමිටුව දහවැනි පාර්ලිමේන්තුවේදී අසුහත් පාරක් හම්බවෙලා තියෙනවා. කෝප් එක රැස්වෙලා තියෙන්නේ තිස්තුන් පාරයි. මේ දක්වාම අපි සියලු දෙනා ඒ කමිටු කාමරය බෙදාගෙන කටයුතු කළේ. අද අමුතු නියෝග යක් ඇවිල්ලා...' යනුවෙන් හර්ෂ එහිදී කියා සිටියේය.

මීට අමතරව පසුගිය සතියේ හර්ෂගේ මුදල් කමිටුව සම්බන්ධයෙන්ද සභානායක බිමල් රත්නායක මහතා පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් සිදුකළේය. එහිදී බිමල් කියා සිටියේ පාර්ලිමේන්තුවට ගෙන එන සියලු මුදල් අණ පනත් මුදල් කාරක සභාවට යොමුකළ යුතු බවට ස්ථාවර නියෝගවල සඳහන් නොවන බවකි. ඊට ප්‍රතිචාර දක්වමින් හර්ෂ කියා තිබුණේ එසේ නම් මුදල් කමිටුවෙන් වැඩක් නැති බවත්, එය වසා දැමීමට කටයුතු කළ යුතු බවත්ය.

## කසිප්පු ගොවියන්

**මේ දිනවල ආණ්ඩුව මුහුණ දී සිටින ඊළඟ ප්‍රධානම ප්‍රශ්නය වී ඇත්තේ රට පුරාම සිටින ගොවීන් ඒ ඒ දිස්ත්‍රික්ක මට්ටමින් තැන් තැන්වල ආරම්භ කර ඇති උද්ඝෝෂණ ව්‍යාපාරය. විශේෂයෙන්ම සිය වී අස්වැන්නට සාධාරණ මිලක් ආණ්ඩුව ලබා නොදෙන බව කියමින් ගොවීන් විසින් සිදුකරන මෙම උද්ඝෝෂණ ව්‍යාපාරවලට විශාල ගොවි සහභාගිත්වයක් පවතින ආකාරයක්ද දැකගත හැකිය.**

කෙසේවෙතත් තත්ත්වය වඩාත් බරපතළ තැනකට පෙරළෙන ආකාරයක් දැකගන්නට ලැබුණේ ආණ්ඩුවේ වගකිව යුතු මැති ඇමැතිවරුන් ඊට දැක්වූ ප්‍රතිචාරයත් සමඟය. විශේෂයෙන්ම වී මිල සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍ය කේ.ඩී. ලාල්කාන්ත මහතා සහ නියෝජ්‍ය අමාත්‍ය නාමල් කරුණාරත්න මහතා තැන් තැන්වල කළ ප්‍රකාශයන් හේතුකොට ගෙන ගොවියන්ගේ කෝපය දෙගුණ තෙගුණ වී තිබූ ආකාරයක් දැකගත හැකි විය. එමෙන්ම රට පුරා සිටින ගොවි සංගම් නියෝජිතයන් යැයි කියමින් ජවිපෙට හිතවත් ගොවි සංවිධාන කිහිපයක් කෘෂිකර්ම අමාත්‍යාංශයට ගෙන්වා සාකච්ඡා කිරීමත්, පොළොන්නරුවේ නියෝජ්‍ය අමාත්‍ය ටී.බී. සරත් ගොවියන් කසිප්පුකාරයන් ලෙස හැඳින්වීමත්, මාලිමා මන්ත්‍රී අරුණ පනාගොඩ මේ උද්ඝෝෂණ කරන්නේ 'ඔරිජිනල්' ගොවීන් නොව 'ආටිෆිෂල්' ගොවියන් බවට කළ ප්‍රකාශයක් නිසා ගොවීන්ගේ කෝපය ඉහවහා ගොස් තිබිණි.

## අනුර ලාල්කාන්තව මෙල්ල කරයිද?

**සාමාන්‍යයෙන් ලාල්කාන්ත සැලකෙන්නේ කියන්න තියෙන දේ කෙළින්ම මුහුණටම කියන කිසිවකුටත් බය නැති නාහෙට අහන්නේ නැති අමාත්‍යවරයකු ලෙසටය. ඒ අනුව, ගොවි උද්ඝෝෂණ කෙතරම් තීව්‍ර වුවද තමන් කළ ප්‍රකාශයන් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කිරීමට හෝ ඒවායේ සැර බාල කිරීමට ලාල්කාන්ත කටයුතු කළ බවක් පසුගිය කාලයේ දැකගන්නට නොතිබිණි.**

නමුත් ලාල්කාන්ත එසේ කළද ඔහු සහ ඇතැම් මැතිඇමැතිවරුන් කළ ප්‍රකාශ කරහා තත්ත්වය බරපතළ අතට පෙරළී ඇති බවක් ආණ්ඩුවේ මැති ඇමැතිවරුන්ට පමණක් නොව ජනාධිපතිවරයාටද වැටහී ගොස් තිබිණි. ඒ අනුව ජනාධිපතිවරයා මේ වනවිට තීරණය කොට ඇත්තේ මෙම ප්‍රශ්නය පිළිබඳ ලාල්කාන්ත සහ නාමල් කරුණාරත්න ගෙන්වා සාකච්ඡා කිරීමටය. ලාල්කාන්ත මෙල්ල කිරීම ජනාධිපතිවරයාටද අපහසු කරුණක් වුවත් ජනාධිපතිවරයා මේ වනවිට එම ගනුදෙනුව ආරම්භ කොට ඇති ආකාරයක් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය.

## ඩේලි මිරර් බොරුව

**ජනාධිපතිවරයා ක්‍රිකට් ආයතනය විසුරුවා හැර ඉරාන් වික්‍රමරත්න මහතාගේ සභාපතිත්වයෙන් ක්‍රිකට් අතුරු පාලක කමිටුවක් පත්කිරීමත් සමග මතුවූ තත්ත්වයන් එකින් එක පියවරෙන් පියවර 'රාජ්‍ය රහස්' තීරයේ වාර්තා කිරීමට පසුගිය මාස කිහිපය පුරාම අපි කටයුතු කළෙමු. පසුගිය සතියේද ඒ සම්බන්ධයෙන් විශේෂ සටහනක් තබමින් අප කියා සිටියේ මේ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සභාපති ජේ ෂා මහතා ලංකාවට පැමිණීමට නියමිතව ඇති බවත්, හෙතෙම ජනාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමට නියමිතව ඇති බවත්ය.**

එමෙන්ම මීට සති දෙකකට ඉහතදී ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය මගින් ජනාධිපතිවරයාට ලිපියක් යොමුකොට තිබූ බවත්, එහි තිබූ කරුණු ලංකාවට එතරම් යහපත් නොවන බවත් පසුගිය සතියේ අප 'රාජ්‍ය රහස්' තීරයේ වාර්තා කර තැබුවෙමු. එහිදී අප කියා සිටියේ මාස 3ක් ඇතුළත, එනම් ජූලි 31 වැනිදා වනවිට ක්‍රිකට් නිලවරණය පවත්වා අවසන් කිරීමට ආණ්ඩුව පියවර ගත යුතු බවටත්, එසේ නොමැති වුවහොත් බංග්ලාදේශයේ සිදුවූ ආකාරයට ක්‍රිකට් තහනමක් පැනවීමේ අවදානමක් මතුවනු ඇති බවටත් එහි සඳහන්ව තිබූ බවකි. මේ සම්බන්ධයෙන් විවිධ කටකතාද ඒ දිනවල ක්ෂේත්‍රයේ පැතිර ගිය ආකාරයක්ද දැකගන්නට ලැබිණි.

පසුගිය සතියේ ජේ ෂා ලංකාවට පැමිණ ජනාධිපතිවරයාත්, ක්‍රිකට් අතුරු කමිටුවේ ප්‍රධානීනුත් සමග සාකච්ඡා කළේ මෙවැනි පසුබිමක් යටතේය. වෙනදා නම් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සභාපතිවරුන් ලංකාවට පැමිණ සාකච්ඡා කිරීම විශාල පුවතක් වුවත් මේ පුවතට ආණ්ඩුව පැත්තෙන් හෝ මාධ්‍යවලින් විශාල ප්‍රචාරයක් දුන් ආකාරයක් දැකගන්නට ලැබුණේ නැත. මාධ්‍යවලද ජනාධිපතිවරයා සහ ජේ ෂා හමුව සම්බන්ධයෙන් ඡායාරූපයක් පමණක් පළවුවද එහිදී දෙදෙනා අතර සාකච්ඡාවට ලක්වූයේ මොනවාද යන්න පිළිබඳ ජනාධිපති මාධ්‍ය ඒකකයෙන් හෝ වෙනත් නිල පාර්ශ්වයකින් කිසිදු තොරතුරක් වාර්තා වී තිබුණේ නැත.

එසේ තිබියදීත් 'ඩේලි මිරර්' පුවත්පත ක්‍රිකට් ක්ෂේත්‍රයේ ගිය කටකතා සහ වෙනත් කතා පුවතක් ලෙස මහත් අතිශයෝක්තියකින් යුතුව පසුගිය සඳුදා (22) දිනයේදී සිය මුල් පුවත මගින්ම "Hold SLC Elections or Get Blacklisted" ICC Informs President AKD යන සිරස්තලයෙන් වාර්තා කොට තිබුණේ 'එක්කෝ ඡන්දය තියන්න, නැත්නම් අසාදු ලේඛනයට ඇතුළත් වන්න - අයි.සී.සී.ය ජනාධිපතිවරයාට දැනුම් දෙයි' යනුවෙනි. මෙම පුවත 'ඩේලි මිරර්' පුවත්පත වාර්තා කොට පැය කිහිපයක් යෑමට මත්තෙන් වහාම ප්‍රතික්ෂේප කිරීමට ජනාධිපති මාධ්‍ය ඒකකය කටයුතු කිරීම විශේෂ සිදුවීමක් විය. නමුත් එම පුවත නිවැරැදි කිරීමේදීද යම් යම් කොටස් අත්හැර දමා පළකිරීමට 'ඩේලි මිරර්' පුවත්පත කටයුතු කොට තිබිණි. ඒ අනුව පාඨකයන්ගේ දැනගැනීම සඳහා ජනාධිපති මාධ්‍ය ඒකකය මගින් නිකුත් කළ නිවේදනය සම්පූර්ණයෙන් පළකිරීමට අප කටයුතු කරමු.

පහත දැක්වෙන්නේ එම නිවේදනයය.

*"Hold SLC Elections or Get Blacklisted" ICC Informs President AKD යන සිරස්තලයෙන් 'ඩේලි මිරර්' පුවත්පතේ මුල් පිටුවේ පළකර ඇති අසත්‍ය සහ නොමග යවනසුළු පුවත රජය දැඩි ලෙස ප්‍රතික්ෂේප කරයි.*

*මෙම වාර්තාවට කිසිදු සත්‍ය පදනමක් නොමැති අතර, ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා සහ ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සභාපති ජේ ෂා මහතා අතර ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවැති හමුව සිතාමතාම විකෘති කර දැක්වීමකි.*

*මෙම සාකච්ඡාවේදී ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව, බිම් මට්ටමින් සහ තරුණ තරුණියන් සඳහා වන ක්‍රිකට් වැඩසටහන් මෙන්ම තරුණ ක්‍රීඩකයන් සඳහා අවස්ථා පුළුල් කිරීම පිළිබඳ අවධානය යොමු වූ බව ජනාධිපතිවරයා සහ අයි.සී.සී. සභාපතිවරයා යන දෙදෙනාම සිය 'එක්ස්' ගිණුම් ඔස්සේ නිල වශයෙන් තහවුරු කළහ. එහිදී කිසිදු අවසාන නිවේදනයක්, අසාදු ලේඛනයට ඇතුළත් කිරීමේ තර්ජනයක් හෝ නිලවරණයට අදාළ කරුණක් සාකච්ඡා නොවූ අතර, එවැනි කිසිදු අවසාන නිවේදනයක් නිකුත් කර නොමැත.*

*ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා සහ අයි.සී.සී. සභාපතිවරයා යන දෙදෙනාගේම නිල ප්‍රකාශයන් සෘජුවම පරිශීලනය කිරීමට පාඨකයන්ට අවස්ථාව තිබියදී, මෙවැනි ප්‍රබන්ධිත පුවතක් පළකිරීම අදාළ පුවත්පතේ විශ්වසනීයත්වය තවදුරටත් පළුදු කිරීමට හේතු වේ. එම අසත්‍ය පුවත සම්බන්ධයෙන් වන මෙම නිවේදනය ප්‍රසිද්ධියේ පළ කරන ලෙසත්, අදාළ පුවත මුද්‍රිත සහ අන්තර්ජාල සංස්කරණය යන දෙකෙන්ම ඉවත් කර ගැනීමට කටයුතු කරන ලෙසත් රජය ඩේලි මිරර් පුවත්පතෙන් ඉල්ලා සිටියි.*

*ජනාධිපති මාධ්‍ය අංශය*

*2026.06.22*

## ඇත්තටම වුණේ මොකද්ද?

**එසේ නම් ඇත්තටම ජනාධිපතිවරයා සහ ජේ ෂා අතර මෙම හමුවේදී සාකච්ඡා වූයේ කුමක්ද? කිසිදු මාධ්‍යයකින් නිවැරැදිව වාර්තා නොකළ එම පුවත මෙවර 'රාජ්‍ය රහස්' තීරයේ නිවැරැදිව වාර්තා කිරීමට අප සූදානම්ය. අප මෙම තොරතුරු වාර්තා කරන්නේ සුපුරුදු පරිදි එක් පැත්තකින් තොරතුරු ගැනීමෙන් පමණක් නොව, පාර්ශ්ව කිහිපයකින්ම එම තොරතුරු ලබාගෙන, වරක් දෙවරක් නොව තුන්වරක්ම එම තොරතුරු තහවුරු කරගැනීමෙන් අනතුරුවය.**

ඒ අනුව ජනාධිපතිවරයා සහ ජේ ෂා අතර පැවැති සාකච්ඡාව ජනාධිපතිවරයා කිසිසේත්ම සතුටට පත්වූ සාකච්ඡාවක් නොවුණු බව නම් මෙහිදී පැහැදිලිවම සඳහන් කළ යුතුය. විනාඩි 17ක් පුරා පැවැති මෙම සාකච්ඡාවේදී ආරම්භයේ සිටම ජේ ෂා සියුම් රාජ්‍යතාන්ත්‍රික භාෂාවක් භාවිත කරමින් කටයුතු කිරීම විශේෂ සිදුවීමක් විය. එහිදී ඔහු පැහැදිලිවම ජනාධිපතිවරයාට පෙන්වා දුන්නේ ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ නීතිරීතිවලට අනුව කටයුතු කිරීමට ක්‍රිකට් ක්‍රීඩා කරන සාමාජික රටවල් බැඳී සිටින බවත්, සියලු රටවල් එම නීතිවලට අනුව කටයුතු කළ යුතු බවත්ය. විශේෂයෙන්ම මෑතකදී බංග්ලාදේශයද අතුරු කමිටුවක් පත්කිරීමට කටයුතු කළ අවස්ථාවේදී ඊට මාස 3ක කාලයක් පමණක් ලබාදීමට අයි.සී.සී.ය කටයුතු කළ ආකාරයත්, එම මාස 3ක කාලය ඇතුළත අනිවාර්යයෙන්ම නිලවරණයක් ඔස්සේ ව්‍යවස්ථානුකූලව ක්‍රිකට් කමිටුව පත්කර ගැනීමට බංග්ලාදේශය කටයුතු කළ බවත් ජේ ෂා ජනාධිපතිවරයාට පෙන්වා දුන්නේය.

එසේ නොවුණහොත් අයි.සී.සී.යේ ප්‍රධාන කමිටුවට එම රටවල් ඇතුළත් කරගත නොහැකි බවද ජනාධිපතිවරයාට පෙන්වා දුන් ජේ ෂා, මෙවැනි තත්ත්වයක් ඇතිවුවහොත් මතුවිය හැකි අවාසිසහගත තත්ත්වයන්ද ජනාධිපතිවරයාට පෙන්වා දුන්නේය.

කෙසේ වෙතත් ජනාධිපතිවරයාද මෙහිදී තමන්ගේ පාර්ශ්වයෙන් කීමට ඇති කරුණු නිශ්චිත අයුරින් ජේ ෂාට දැනුම් දීමට පියවර ගත්තේය. එහිදී ජනාධිපතිවරයා පෙන්වා දුන්නේ ක්‍රිකට් ආයතනය තුළ මේ වනවිට මතුව ඇති අර්බුදයන් නිරාකරණය කරගැනීම සඳහා මාස 3ක කාලයක් ප්‍රමාණවයත් නොවන බවය. අවම වශයෙන් එම අර්බුද නිරාකරණය කරගෙන නව ක්‍රිකට් ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා වසරක පමණ කාලයක් ගතවන බවද ජනාධිපතිවරයා ජේ ෂාට පෙන්වා දුන්නේය.

ඊට පැහැදිලි පිළිතුරක් ජේ ෂා ලබා නොදුන්නද එහිදී ඔහු කියා සිටියේ එසේ වන්නේ නම් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ රැස්වීම්වලට සහභාගි නොවී, කමිටුවෙන් පිට නිරීක්ෂකයකු ලෙස පමණක් කටයුතු කිරීමට සිදුවනු ඇතැයි කියාය. පසුගිය කාලයේදී බංග්ලාදේශයටද එවැනි තත්ත්වයකට මුහුණ දීමට සිදුවූ බව පෙන්වා දුන් ජේ ෂා බංග්ලාදේශය ක්‍රිකට් නිලවරණය පැවැත්වීමෙන් අනතුරුව ඔවුන්ට නිල තත්ත්වය ලැබුණු බවත්, ලංකාව එසේ ජූලි 31 වැනිදාට පෙරාතුව ඡන්දය පවත්වා ව්‍යවස්ථානුකූල අයුරින් කටයුතු කළ යුතු බවත් පෙන්වා දුන්නේය.

මීට පෙරාතුව වරක් අප ක්‍රිකට් සම්බන්ධයෙන් රාජ්‍ය රහස් තීරය ඔස්සේ තොරතුරු වාර්තා කරමින් පෙන්වා දුන්නේ ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයෙන් මතුවිය හැකි ගැටලුවට මුහුණ දීම සඳහා සැලසුම් දෙකක් ජනාධිපතිවරයා සතුව පවතින බවකි. ඉන් පළමු සැලසුම ලෙස අප අනාවරණ කළේ අයි.සී.සී.යේ. අනුමැතිය සහිතව ක්‍රිකට් අතුරු කමිටුවේ කාලය වසරකට දීර්ඝ කරගැනීමට ජනාධිපතිවරයා උත්සාහ කරන බවකි. දෙවැන්න ලෙස අප අනාවරණ කළේ එසේ කරගැනීමට නොහැකි තත්ත්වයක් උදාවුවහොත් ආණ්ඩුවේ පාර්ශ්වයෙන් ශක්තිමත් කණ්ඩායමක් ඉදිරිපත් කොට ක්‍රිකට් නිලවරණය පැවැත්වීමේ සැලැස්මක් ජනාධිපතිවරයා සතුව ඇති බවකි. ඒ අනුව මෙම සාකච්ඡාවේදී ජේ ෂා දිගටම අයි.සී.සී. නීතිරීතිවලට අනුව ලංකාව කටයුතු කළ යුතු බවට දැනුම් දී සිටීම නිසා අවසානයේදී ජනාධිපතිවරයා කියා සිටියේ මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය වුවහොත් තමන් ඊටද සූදානම් යැයි කියාය. ඒ අනුව දූෂණයෙන් තොර පිරිසිදු කණ්ඩායමක් ක්‍රිකට් නිලවරණයට ඉදිරිපත් කිරීමට තමන් සූදානම් බවද ජනාධිපතිවරයා මෙහිදී ජේ ෂාට දැනුම් දී සිටියේය. ජනාධිපතිවරයා සහ ජේ ෂා අතර පැවැති විනාඩි 17ක හමුවේදී සත්‍ය වශයෙන්ම සිදුවූයේ මෙයය. ඊට පරිබාහිර අනෙකුත් සියලු කතා සම්පූර්ණයෙන්ම අසත්‍ය ඒවා බව 'රාජ්‍ය රහස්' වගකීමෙන් යුතුව වාර්තා කිරීමට සූදානම්ය.

## පඩි ගෙවන්නත් සල්ලි නෑ

**කෙසේ වෙතත් මේ වනවිට ක්‍රිකට් ආයතනය දැඩි මූල්‍ය අර්බුදයකටද මුහුණපා සිටින බවක් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. අපට ඇති ඇතැම් තොරතුරුවලින් කියැවෙන්නේ ලබන මාසයේ වැටුප් ගෙවීම පවා අසීරු වන තරමට ක්‍රිකට් ආයතනයේ මූල්‍ය තත්ත්වය පහත වැටී ඇති බවකි.**

ඒ බව තහවුරු කරමින් පසුගිය සතයේ පැවැති මාධ්‍ය හමුවකදී ක්‍රිකට් අතුරු කමිටුවේ සාමාජිකයකු වූ ප්‍රකාශ් ෂාෆ්ටර් කියා සිටියේ පසුගිය වසරේ ජනාධිපතිවරයා මුල්ගල තැබූ යාපනයේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීමට පවා අසීරු තත්ත්වයක් මතුව ඇති බවත්, ඒ සඳහා වැයකිරීමට ක්‍රිකට් ආයතනය සතුව මුදල් නොමැති බවත්ය. ඒ අනුව ක්‍රිකට් ආයතනය නැවතත් මුදල්වලින් පිරවීම සඳහා ජේ ෂා දැනුම් දුන් ආකාරයට ජූලි 31 වැනිදාට පෙරාතුව ක්‍රිකට් නිලවරණය පැවැත්වීමේ තත්ත්වයක් මේ වනවිට මතුව ඇති ආකාරයක් දැකගන්නට තිබේ. එසේ වුවහොත් ජනාධිපතිවරයා සූදානමින් සිටින්නේ ඉරාන් වික්‍රමරත්නගේ සභාපතිත්වයෙන් යුත් කණ්ඩායමක් ආණ්ඩුව පැත්තෙන් ක්‍රිකට් නිලවරණයට ඉදිරිපත් කිරීමටය.

කෙසේ වෙතත් ක්‍රිකට් ආයතනයේ හිටපු සභාපති ෂම්මි සිල්වාට ක්‍රිකට් ව්‍යවස්ථාවට අනුව නැවත වතාවක් සභාපති ධුරයට තරග වැදීමට නොහැකි නිසා බොහෝ දෙනා බලාපොරොත්තු වන්නේ ෂම්මිගේ පාර්ශ්වයෙන් තවත් කණ්ඩායමක් ක්‍රිකට් නිලවරණයට ඉදිරිපත් කරනු ඇති බවටය. මන්ද යත් ක්‍රිකට් සංගම්වල වැඩි බලය ෂම්මි ප්‍රමුඛ පාර්ශ්වයට හිමිව තිබීම නිසා ක්‍රිකට් ආයතනයේ යළි බලය ඇල්ලීම ඔවුන්ට අසීරු කාර්යයක් නොවේ. නමුත් 'රාජ්‍ය රහස්' තීරයට ඇති ආරංචිවලින් කියැවෙන්නේ අනුරගේ පාර්ශ්වයෙන් දැනටමත් ඉරාන්ගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් නිලවරණයට ඉදිරිපත් කරන බවට ෂම්මිගේ පාර්ශ්වයට පණිවුඩයක් ලබාදී ඇති බවකි. එහිදී ෂම්මිගේ පාර්ශ්වයෙන්ද ජනාධිපතිවරයාගේ පාර්ශ්වයට යවා ඇතැයි කියන පණිවුඩයකින් කියැවෙන්නේ ඉරාන්ගේ නායකත්වය පිළිගැනීමට සූදානම් නමුත්, කමිටුවේ සෙසු සාමාජිකයන් ලෙස ෂම්මිගේ පාර්ශ්වයෙන් නම් කිහිපයක් යෝජනා කිරීමට සූදානම් බවකි. නමුත් ඊට ජනාධිපතිවරයාගේ පාර්ශ්වයෙන් කිසිදු එකඟතාවක් පළවී නොමැති බවක්ද දැනගන්නට තිබේ. ඒ අනුව මේ දිනවල ක්‍රිකට් නිලවරණය සම්බන්ධයෙන් සහ ඊට පත්කිරීමට නියමිත සාමාජිකයන් සම්බන්ධයෙන් දෙපැත්තට පණිවුඩ හුවමාරු වන ආකාරයක් දැකගන්නට පුළුවන. නමුත් අපට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ ආණ්ඩුව හොඳින් හෝ නරකින් ක්‍රිකට් පරිපාලනය සුද්ද කිරීම සඳහා අවශ්‍ය සියලු සැලසුම් සකස් කරමින් ඇති බවකි.

කපිල පුංචිමාන්නගේ

PAGE - 05



### 14. බිලූමැන්ඩල් සංබ

ප්‍රබල සංවිධානාත්මක අපරාධකරුවකු සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු වන රණසිංහ ආරච්චිගේ සංඛ ශිරාන්ත නොහොත් බිලූමැන්ඩල් සංබ අබුඩාබි සිට මෙරටට පිටුවහල් කරනු ලබන්නේ 2026 ජුනි මස 13 වැනිදාය. කටුනායක ගුවන් තොටුපොළේදී ඔහුව අත්අඩංගුවට ගනු ලබන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසිනි.



### 15. මිදිගම චූටි

හරක් කටාගේ ප්‍රධාන ගෝලයන් දෙදෙනාගෙන් අයෙක් මෙන්ම ප්‍රබල පාතාල අපරාධකරුවෙක් වන රාජපක්ෂ පතිරණලාගේ ප්‍රභාත් මධුසංඛ නොහොත් මිදිගම චූටි 2026 මාර්තු මස 30 වැනිදා අලුයම මෙරටට රැගෙන එන්නේ ඕමානයේ සිටය. ඔහු රතු නිවේදන නිකුත් කර සිටි අයෙකි. ඕමාන් පොලිසිය ඔහුව අත්අඩංගුවට ගෙන තිබුණේ සුපිරි හෝටලයක රැඳී සිටියදීය.

### 16. කරන්දෙණිය රාජු

සෝබනහන්දි සනත් ද සිල්වා නොහොත් කරන්දෙණිය රාජු කුලී ඝාතකයෙක් ලෙස සැලකෙන පාතාලයේ



දරුණු අපරාධකරුවෙකි. ඉන්දියාවට පලාගොස් සිටි ඔහුව එරටදී අල්ලාගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් මෙරටට රැගෙන එනු ලබන්නේ 2026 අප්‍රේල් 17 දාය. ඔහු කරන්දෙණිය සුද්දාගේ සහෝදරයාය.



### 17. බටුවත්තේ චාමර

ප්‍රබල සංවිධානාත්මක අපරාධකරුවකු සහ මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන මනෝජ් සුරංග ලියනගේ නොහොත් බටුවත්තේ චාමර මෙරටට රැගෙන එන්නේ 2026 මැයි 10 වැනිදාය. රාජ්‍ය බුද්ධි සේවය අසර්බයිජාන ආරක්ෂක අංශ සමග කළ මෙහෙයුමක ප්‍රතිඵලයක් ලෙස ඔහු එරටදී අත්අඩංගුවට ගෙන ඇත.

### 18. මහවත්තේ චාමර

මිනිස් ඝාතන ඇතුළු අපරාධ රැසකට සම්බන්ධ චාමර සංජීව කුමාර නොහොත් මහවත්තේ චාමර ඩුබායිහි රැඳී සිටියදී ඉරානය විසින් ඩුබායි වෙත එල්ල කළ ප්‍රහාර වීඩියෝගත කිරීම සම්බන්ධයෙන් එරට ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගෙන මෙරටට පිටුවහල් කළ 30 දෙනා අතර සිටියෙකි.

ඔහුව මෙරටට පිටුවහල් කර එවීමෙන් අනතුරුව ගුවන්තොටේදී අත්අඩංගුවට ගනු ලබන්නේ 2026 මැයි 22 වැනිදාය.

### 19. කුඩු දුමින්ද

බොරැල්ල වනාතමුල්ලෙන් මෑතකදී බිහිවූ පාතාලයේ අපරාධකරුවෙකි. පරෙයි සුද්දා නමැති ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවකුගේ ගෝලයෙක් වන ඔහු ඩුබායි සිට 2026 මැයි 22දා පිටුවහල් කර එවූ අයෙකි.

### 20. කෙසෙල්වත්තේ දිනුෂ

ඩුබායිහිදී හෘදයාබාධයකින් මියගිය ප්‍රබල පාතාල අපරාධකරුවෙක් වන කෙසෙල්වත්තේ දිනුකගේ ප්‍රධාන ගෝලයෙක් වන හේවාපේඩිගේ දිනූෂ චතුරංග නොහොත් කෙසෙල්වත්තේ දිනුෂ ඉන්දියානු ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගෙන මෙරටට පිටුවහල් කරනු ලබන්නේ 2026 ජනවාරි 24 වැනිදාය.

ඔහුව ගුවන්තොටුපොළේදී අත්අඩංගුවට ගනු ලබන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ය.

### 21. චූටි මල්ලි

කඳාන කේන්ද්‍ර කරගනිමින් මිනිස් ඝාතන, මංකොල්ලකෑම් ඇතුළු අපරාධවල නිරතව සිටි රසික චන්දිත කුමාර නොහොත් චූටි මල්ලි අත්අඩංගුවට ගනු ලබන්නේ ඩුබායිහීදීය. ඔහුව මෙරටට රැගෙන එන්නේ 2026 ජනවාරියේදීය.

### 22. ආමි මාටියා

පස් පොඩ්ඩාගේ ඝාතනයට අවශ්‍යව සිටි සැකකරුවෙක් වන ආමි මාටියා මාසයකට පමණ පෙර මැලේසියාවේදී එරට පොලිසියට හසුවී තිබුණි. ඔහුව 2026 ජුනි 25 එරටින් පිටුවහල් කර මෙරටට එවා තිබුණි. ගුවන්තොටුපළේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔහු අත්අඩංගුවට ගත්තේය.

මේ හැරුණු කොට මෙම වසරේ ගෙවුණු කාලය තුළ පාතාලයට සහ මත්කුඩු ජාවාරමට සම්බන්ධ පිරිසක් ඉන්දියාව සහ ඩුබායිවලින් අල්ලා මෙරටට පිටුවහල්කර තිබිණි.

සමාජය තුළ කුප්‍රකට නොවූ එම අපරාධකරුවන් අතර යාපනය මනිප්පායිහි පදිංචිකරුවන් වන දේවා, ප්‍රකාශ්, කඩවත පදිංචිකරුවෙක් වන පැන්ඩා, ඌරගස්මන්හන්දියේ පදිංචිකරුවෙක් වන පුංචා, කොච්චිකඩේ ශිරාන්, ටිංකර්, මෝදර චතුර, බොම්බුගලගේ සුමිත් ප්‍රියන්ත, මොහොමඩ් ෆවුස් ඇතුළු අපරාධකරුවන් රැසක් සිටිති.

රුවන් වෙඩිවර්ධන



# කෙහෙල් ලෙල්ලයි කෙහෙල් කඳයි කෙහෙල් නැට්ටයි කෙහෙල් මලයි

**ශ්‍රී ලංකාව කියල කියන්නෙ සාමාන්‍යයෙන් පලතුරු වර්ග වැවෙන රටක්. අපේ රට හරි සරුසාරයි. අපේ රටේ තියෙන විවිධ සරුසාරකම් එක්ක අපිට විවිධ ප්‍රදේශවල විවිධ පලතුරු වර්ග වගා කිරීමේ හැකියාව ලැබෙනවා. කෙසෙල් ලංකාවෙ හැමතැනම පැළවෙන වගාවක්. ඊට අමතරව සමහර වර්ග තියෙනවා ඒවා ඒ ඒ ප්‍රදේශවලට අනන්‍යයි. ලංකාවෙ සමස්ත පලතුරු වගාවෙන් 54%ක් පමණ කෙසෙල් බව අපට දැනගන්න ලැබෙනවා. විවිධ කෙසෙල් වර්ග පිළිබඳ අපට අහන්න ලැබෙනවා. ඇඹුල්, කෝලිකුට්ටු, සීනි කෙසෙල්, ඒ වගේම ආනමාලු, ඇම්බුන් වගේ කෙසෙල් වර්ග. යම් තරමකට මිල අධික කෙසෙල් වර්ගයක් තියෙනවා, ඒ තමයි නේත්‍රාපලම් කෙසෙල්. ඊට අමතරව රතු පැහැති කෙසෙල් වර්ගයකුත් තියෙනවා ලංකාවෙ, අපි ඒවට කියනවා රත්කෙහෙල් කියලා. යම් ප්‍රමාණයකට මිල අධිකයි කෝලිකුට්ටුත්.**

මේ විදිහට කෙසෙල් ගැන කියනවා නම් ඕනෑ තරම් කෙසෙල් ගැන කතාකරන්න පුළුවන්. හැබැයි මේ වෙලාවෙ කෙසෙල් ගැන කතාකරන්න හේතුව වෙන්නෙ මේ කෙසෙල් ගහ යොදලා, කෙසෙල් ගහ දාලා ඒකෙන් රෙදි ගන්න පුළුවන් කර්මාන්තශාලාවක් ගැන පහුගිය දවසක නාමල් කරුණාරත්න ඇමැතිතුමා කතාවක් කළා. මේ ගැන ඉතින් අපිත් කතා කරන්න හිතුවා. ඒක හරි ෂෝක් වැඩක්. ඇඹිලිපිටියෙ තමයි මේ කර්මාන්තශාලාව අලුතින් ඉදිවෙන්න නියමිතව තියෙන බව දැනගන්න ලැබුණෙ. චීන රජයේ තාක්ෂණික සහාය ඇතිව මේක සිද්ධ වෙන්නෙ. කෙසෙල් වගාවෙන් ඉවත් කෙරෙන කඳන් කර්මාන්තශාලාවට ඇතුළු කළාට පස්සෙ නවීන තාක්ෂණය ඔස්සේ ඒවායින් කෙඳි වෙන්වෙලා නූල් සැකසිලා, සායම් පොගවලා අවසානයේ නිමි ඇඳුමක් විදිහට එළියට එනවා කියලා සඳහන් වෙලා තිබුණා.

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඳුම් ආයතනය සහ මොරටුව විශ්වවිද්‍යාලය එක්ව 'බනානා ටෙක්ස්' නමින් පරිසරහිතකාමී කෙසෙල් නූල් තාක්ෂණයක් මීට පෙර හඳුන්වා දීලා තිබුණා කියලා අපිට දැනගන්න ලැබෙනවා. ඒ වගේම හම්බන්තොට, බණ්ඩගිරිය ප්‍රදේශයේ ගොවීන් සම්බන්ධ කරගනිමින් කෙසෙල් තන්තුවලින් ස්වභාවිකව වර්ණගැන්වූ ඇඳුම්, ඇසුරුම් ද්‍රව්‍ය සහ සනීපාරක්ෂක තුවා නිපදවන සාර්ථක දේශීය ව්‍යාපාරයකට මීට කලින් අඩිතාලම දාලා තිබුණු බවත් අපි හොයද්දී දැනගන්න ලැබුණා. ඒ වගේම දේශීය කෙසෙල් කෙඳි භාවිතයෙන් පරිසරහිතකාමී අත්කම් සහ නූල් නිෂ්පාදනය කරන එම්.යූ.එස්.ඒ.සී.ඕ. කියලා ආයතනයක් ගැනත් අන්තර්ජාලය ඔස්සේ කරන හඳුනා ගැනීම්වලදී අපිට දැකගන්න ලැබුණා.

දැන් මේ ගැන අපි දැක්කා පහුගිය දවසක නාමල් කරුණාරත්න අමාත්‍යවරයා විස්තර කරමින්, කරුණු හඳුන්වා දෙමින් හරිම සතුටින් කටයුතු කරපු ආකාරය. ඒක හරි හොඳයි. මේ විදිහට අලුත් දේවල් ලෝකෙට හඳුන්වා දෙන එක විශේෂ දෙයක්, රටක් විදිහට අපිට ඉදිරියට යන්න මේක හරි වැදගත්. මොකද අපි දන්නවා ඇඹිලිපිටියෙ හරියට කෙසෙල් වැවෙනවා. මේ වගේ වැඩ කරන්න කලින් වැහීගෙන යන ඇඟලුම් කර්මාන්ත ශාලා ටික ආරක්ෂා කරගන්න කියලා අපි දැක්කා සජිත් ප්‍රේමදාස මහත්තයා කියනවා. හිටපු අමාත්‍යවරයෙක් වෙච්ච විමල් වීරවංශත් මේ ගැන ෆේස්බුක් ගිණුම හරහා සටහනක් තියලා තිබුණා. මේ කෙසෙල් කෙඳිවලින් රෙදි නිපදවීම අලුත් දෙයක් නෙවෙයි, මේක මීට කලින් එතුමන් ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයත් එක්ක සම්බන්ධව හිටපු කාලේ, 2019 ඔහු කර්මාන්ත අමාත්‍යවරයා විදිහට හිටපු කාලේ මේ වැඩේ කරළියට ආවා කියලා ඔහු සඳහන් කරලා තිබුණේ.

කොහොම වුණත් අපිට කියන්න තියෙන්නෙ දැන් මේ වෙලාවෙ මේ කෙසෙල් කඳන්වලින් රෙදි හදන්න කලින් මේගොල්ලො ඡන්දෙ තියෙන වෙලාවෙ කිව්වා කියලා සමහර තැන්වල සඳහන් වෙලා තිබුණා 'කෙසෙල් ගෙඩියට නැට්ට හයිකරන්න පුළුවන්' විදිහේ දැනුම සහිත අයත් ඉන්නවා කියලා මේ පාර්ලිමේන්තුවේ. එවැනි අය අරන් ඇවිල්ලා මේ කෙසෙල් ගෙඩියට නැට්ට හයි කරලා ඉස්සෙල්ලා කෙසෙල් වෙළෙඳපොළ සාර්ථක කරලා, ඒ සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් එහෙම නිර්මාණය කරලා මෙවැනි දේවල් එළියට අරන් ඇවිල්ලා මේවා රටේ ස්ථාවර කරලා මේවයින් විදේශ විනිමය ගේනවා නම් හොඳයි. මේවා නරක දේවල් නෙවෙයි. මොකද රටකට අවශ්‍ය වෙන්නෙ අලුත් දේවල්, අලුතින් හිතන අය, අලුත් සිතිවිලි.

මේවා අලුත් සිතිවිලි නෙවෙයි පැහැදිලිව හොයලා බලද්දි පේනවා ලංකාවේ මීට කලින් මේවා කරලා තියෙනවා. විමල් වීරවංශ මහත්තයා මේ ක්‍රෙඩිට් එකක් දාගන්න හැදුවට එතුමට ක්‍රෙඩිට් එකක් දෙන්න අපි හදනවා නෙවෙයි. අපිට විමල් වීරවංශද මේක කළේ, රනිල් වික්‍රමසිංහද, මහින්දද, අනුරද කියන එක වැඩක් නැහැ. දැන් මේ වැඩේ අපි කියන්නේ නරකයි කියලා නෙවෙයි, මේ වැඩේ හොඳයි. නමුත් ඉදිරියේදී මෙවැනි වැඩපිළිවෙළවලට කඩිනමින් කටයුතු සකස් කරනකොට ඊට වඩා මේ රටේ වෙන්න තියෙන ඉතා වැදගත් දේවල් ගැනත් හිතුවා නම් ඊට වඩා හොඳයි කියලයි අපේ නම් යෝජනාව.

කොහොම වුණත් ඉස්සරහට අපිට කෙසෙල් කඳෙන් එන නූල්වලින් එසැණින් රෙදි හදලා අනිත් පැත්තෙන් රෙදි අරගෙන ඇඳගෙන යන්න පුළුවන් කාලයක් උදාවෙනවා කියන එක මතක් වෙද්දි නම් හිතට දැනෙන්නේ වචනයෙන් විස්තර කරන්න බැරි තරම් සතුටක්. ඉතින් අපි ඉස්සරහට කෙසෙල් කඳන්වලින් එන රෙදි ඇඳලා සතුටින් ඉමු. එතකොට අපිට තියෙන ප්‍රශ්න ගොඩක් අඩු වෙයි, මේ රටේ තියෙන ප්‍රශ්න ගොඩක් අඩු වෙයි. ණය ගෙවාගන්න බැරි ප්‍රශ්න නැති වෙලා යයි. අපිට ඔය නූල්වලට, සායම්වලට, අරවට මේවට යන වියදම් ටිකක් අඩු කරගන්න පුළුවන්නේ.

රෙදි නැතුව ඉන්නවට වඩා කෙසෙල් කඳන්වලින් හරි රෙදි අරගෙන ඒවා ඇඳන් ඉන්නවා නම් හොඳයිනේ. නැත්නම් ඉතින් ඉස්සරහට රෙදි නැතුව ඉන්න වෙන තත්ත්වයක් තමයි නිර්මාණය වෙලා තියෙන්නේ. මොකද රෙද්දක් ගන්න පුළුවන් මට්ටමකට නෙමෙයි මේ රටේ ආර්ථිකය ඉහළ ගිහිල්ලා තියෙන්නේ. ඒ ගැන එක එක ඒවා කිව්වොත් ඉතින් අපිටත් කියන්න හිතෙනවා එක එක රෙද්දවල් කතා කරන්න එපා කියලා. කොහොම වුණත් මේ රෙද්ද නම් 'එක එක රෙද්දවල් ගැන කතාකරන්න එපා' කියලා අමතක කරන්න පුළුවන් රෙද්දක් නෙවෙයි. හැබැයි මතක තියාගන්න මේ රෙද්දවල් ගැන කතා කරන්න කලින් අපිට රෙදි නැතුව ඉන්න වෙන ප්‍රශ්නයක් රටේ නිර්මාණය වෙලා තියෙන එක ගැන මතක් කරලා, ඒ නිසා මේ රෙදි ඇඳගෙන ඉන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරලා දෙන්න කියලා විශේෂයෙන්ම මාලිමාවට ඡන්දේ දුන්න අයට රෙද්දක් ඇඳන් පාරේ යන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරන්න කියලත් මේ අමාත්‍යවරයාට සහ සියලු අමාත්‍යවරුන්ට ආදරෙන් මතක් කරනවා.



ජීවන පහන් තිළිණ


මව්රට
දැන් ඉරිදා
සම්මා සම්බුදු දහම බුද්ධියෙන් විමසමින්
අපගේ ජීවිතවලට ගලපන දහම් කතිකාවත
ජුනි 29 පහන් කූඩුව
ජුනි 30 බැති ගී ප්‍රසංගය
01 ජූලි
සවස 7.00 සිට
තලමල්ගම පොලිසිය අසලදී...
හොරොව්පතාන කුඩාගම ශ්‍රී බෝධිමළු විහාරාධිකාරි,
ශ්‍රී වික්‍රමශිලා දහම් පාසලේ ප්‍රධානාචාර්ය
කාව්‍ය ශ්‍රී පූජනීය මහවැවේ ධම්මවංශ
ස්වාමීන් වහන්සේ පවත්වනු ලබයි
අසිරිමත්
කාව්‍යමය ධර්ම දේශනය
කඩල සහ අයිස්ක්‍රීම් දන්සල
සංවිධානය -
තලමල්ගම පොලිසිය
සිවිල් ආරක්ෂක කමිටු
මව්රට ජාතික පුවත්පත
සවස 7.00 සිට තලමල්ගම පොලිසිය අසලදී...





ගල්වෙහෙරගම
පොසොන්
මහා බත් දන්සල
ගෝනගම ගල්වෙහෙරගම පෝයමලු විහාරස්ථානයේ සංවිධායකත්වයෙන් ගල්වෙහෙරගම, හැලබඩගම ප්‍රදේශවාසීන්ගේ දායකත්වයෙන් පවත්වනු ලබන බත් දන්සල පොසොන් පුන් පොහෝ දින දවස පුරා ගල්වෙහෙරගම දන්සල් ශාලාවේදී පැවැත්වේ. මේ සඳහා සහභාගි වන ලෙස ප්‍රදේශවාසී සැමට සංවිධායක මණ්ඩලය ඇරයුම් කර සිටී.





හොරොව්පොතාන කුඩාගම ශ්‍රී බෝධිමලු විහාරාධිකාරි ශ්‍රී වික්‍රමශිලා දහම් පාසලේ
ප්‍රධාන ආචාර්ය රූපවාහිනී ගුවන් විදුලි කාව්‍යම ධර්ම දේශක
කාව්‍ය ශ්‍රී මහවැවේ ධම්මවංශ ස්වාමීන් වහන්සේගේ අවවාද අනුසානා පරිදි.
ශ්‍රී වික්‍රමශිලා දහම් පාසලේ දූ දරුවන් විසින් සංවිධානය කරනු ලබන
පහන් දෙදහසක
ආශීර්වාදාත්මක පහන් පූජාව
- දේශකයාණන් වහන්සේ -
වැලිමුවපොතානේ සීලවංශ
ස්වාමීන් වහන්සේගේ ගෞරවණීය වැඩමවීමෙන්
ජුනි 29 කුඩාගම ශ්‍රී බෝධිමලු විහාරස්ථානයේදී පැවැත්වේ..
මාධ්‍ය දායකත්වය
මෙත් සිතින් ඔබ සැමට ආරාධනා..!



ගෝනගම
මිහිඳු මහා
පෙරහැර
ගෝනගම මල්අස්න මලියදේව අරහන්ත විහාරය 28 වැනි වරටත් පවත්වනු ලබන මිහිඳු මහා පෙරහැර ජුනි 30 වැනිදා සවස 6.00ට බටුවැව කහටග හමුල මංසන්ධිය, මල්අස්න මංසන්ධිය හරහා මලියදේව අරහන්ත විහාරය දක්වා වීථි සංචාරය කිරීමට නියමිතය.
ප්‍රදේශයේ පුණ්‍ය කටයුතු වෙනුවෙන් නිරන්තර දායකත්වය ලබාදෙන ගෝනගම නිවුස් සෙන්ටර් අධිපති අතුල ආලෝක බණ්ඩාර මහතා පෙරහැර වෙනුවෙන් ප්‍රචාරක අනුග්‍රහය ලබාදෙයි.


කොළඹ 05, කිරුළපන, ජයරත්න මාවත, අංක 22හි පිහිටි ශ්‍රී මීඩියා ඉන්ඩිපෙන්ඩන්ට් නෙට්වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින්, මත්තේගොඩ නිවාස සංකීර්ණය පාර, අංක: 102/176හි පිහිටි සයුරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේදී 2026 ජුනි 28 වැනි ඉරිදා මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.